www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය


# දේශපාලන චරිතාපදානය හා ඓතිහාසික මුසාව:
# රොබට් සර්විස්ගේ ට්‍රොට්ස්කි පිලිබඳ විමසීමක්

Political biography and the historical lie: An examination of Robert Service’s *Trotsky*

**2010 මැයි 06**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කතෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ රොබට් සර්විස්ගේ චරිතාපදානය අලලා ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ සෙන්ට් කැතරින්ස් විද්‍යාලයේ බර්නාඩ් සන්ලි ශාලාවෙහි 05 දින පැවැත්වූ දේශනයට සවන් දීම සඳහා සිසුන්, ශාස්ත්‍රාලිකයින් හා කම්කරුවන් 95 දෙනෙක් රැස්ව සිටියහ.*




*ශ්‍රාවකය ජාත්‍යන්තර සංයුතියකින් සැදුම් ලත් අතර ඔවුහු දකුනු අප්‍රිකාව, චීනය, ශ්‍රී ලංකාව, ඉන්දියාව, තුර්කිය, ප්‍රන්සය හා තවත් රටවල් ගනනාවකට අයත් වූහ. පැයකට වැඩි කාලයක් තිස්සේ දේශනයට සාවධානව සවන් දීමෙන් අනතුරුව ශ්‍රාවකයෝ ප්‍රශ්න ගනනාවක් මතුකලහ.*

*ශ්‍රාවකයන් ගනනාවක්ම සර්විස්ගේ සිසුන් හෝ ඔක්ස්ෆර්ඩ් සරසවි පීඨයේ ඔහු දරන ප්‍රමුඛ ස්ථානය ගැන දැන සිටි අයයි. ප්‍රශ්නයක් ඇසූ එක් අයෙක් තම කෘතිය ආරක්ෂා කිරීම සඳහා සර්විස් දේශනයට සහභාගී නොවීම පිලිබඳව මවිතය පලකලේය.*

*මේ මාතෘකාව පිලිබඳව නෝර්ත් මීට පෙර විමර්ෂන හා දේශන පවත්වා තිබේ. ඊට, “ට්‍රොට්ස්කිගේ ‘දැවැන්ත හා චිරකාලීන ඓතිහාසික වැදගත්කම’ ආරක්ෂා කිරීම සඳහා”; “‘මහා බොරුවේ’ සේවය සඳහා කැපවූ ඉතිහාසඥයන්” හා “ඓතිහාසික මුසාකරනයේ සේවය සඳහා” යන මාතෘකා ඇතුලත්ය.*

* * *

පසුගිය සිසිර සෘතුවේදී රොබට් සර්විස්ගේ ලියොන් ට්‍රොට්ස්කි චරිතාපදානය පලකිරීමෙන් පසුව මා, එක් දිග විමර්ෂනයක් ලියා ඇති අතර ලංඩන්හි ද සිඩ්නිහි ද දේශන දෙකක් පවත්වා තිබේ. මෙම පොත පිලිබඳ මාගේ තෙවන දේශනය මෙයයි. මා මෙතෙක් කියා ඇති හා ලියා ඇති දේට අමුතුවෙන් එකතු කිරීමට ඇත්තේ කුමක් දැයි යමෙක් මවිතයට පත්වීම යුක්තිසහගතය. අද සවස පැවැත්වෙන දේශනයට සූදානම් වීමේදී මේ සිතුවිල්ල මගේ සිතෙහි ද මතු විය. අලුත් ශ්‍රාවකත්වයක් ඉදිරියේ නමුත් මා සිටින්නේ දැනටමත් මා කියා ඇති දේ යලි පුනරුච්චාරනය කිරීමේ තත්වයක ද? බොහෝ කොටසකට අදාලව එය එසේ නොවේ. සමහර දේ පුනරුච්චාරනය වීම නොවැලැක්විය හැකි නමුත් තවත් කීමට බොහෝ දේ තිබේ.

මාස ගනනක විරාමයකින් පසුව යලිත් සර්විස් මහතාගේ චරිතාපදානය වෙත යොමුවන විට කරුනු දෙකක් මට පැහැදිලි විය. පලමුවැන්න, මට මතක තිබුනාට වඩා මේ පොත නරක බවය. දෙවැන්න, සර්විස් මහතාගේ චරිතාපදානය තුල දැකගත හැකි කාරනාමය දෝෂ. අර්ධ සත්‍යයන්, විකෘති කිරීම්, මුසාකරන හා අමූලික මඩගැසීම් සියල්ල මා එවකට හඳුනාගෙන නොසිටි බවයි. සැබවින්ම ඔහුගේ කෘතියෙහි ඇති වැරදි සියල්ල සොයාගැනීම, ඔක්ස්ෆර්ඩ් ඉතිහාස දෙපාර්තමේන්තුවේ උපාධිධාරීන් ගනනාවක් මාස කිහිපයක් තිස්සේ නිරත විය යුතු වෙහෙසකර කර්තව්‍යයකි. ආරම්භක විමර්ෂනය තුල මා ලිවූ දේ

අතිශයෝක්තියක් නොවේ. ඔහුගේ සාධකමය වශයෙන් සදොස්, අවශ්‍ය පිලිගැනීමෙන් තොර හා උගත්කමේ පිලිගත් සම්මතයන් උල්ලංඝනය කල සෑම ප්‍රකාශයක්ම නිෂ්ප්‍රභා කිරීම සඳහා සර්විස්ගේ කෘතිය තරම්ම දිග වෙලුමක් අවශ්‍ය වනු ඇත. ශුද්ධ වෘත්තීය දෘෂ්ටි ආස්ථානයක සිට ගත්කල, කිසිසේත්ම පිලිගත නොහැකි ප්‍රකාශ හා අවධාරනයන් සෑම පරිච්ඡේදයකදීම පාහේ හමුවෙයි.

මම මීට පෙර, සර්විස්ගේ චරිතාපදානයේ අතිශය ද්වේෂ සහගත ඡේද කෙරෙහි අවධානය යොමුකලෙමි. එනම්, ඔහු විසින් ට්‍රොට්ස්කිගේ පුද්ගලික ජීවිතය හා චරිතය ඝාතනය කිරීමේ අරමුන ඇතිව නිරූපනය කල අවස්ථාවන්ය. ඔහුගේ හැඳින්වීම තුල ඔහු පිලිගත් පරිදි, අයිසැක් ඩොයිස්චර්ගේ විචිත්‍රවත් තුන්ඈඳී චරිතාපදානයේ ( *The Prophet Armed,* සන්නද්ධ අනාගත වක්තෘ, *The Prophet Unarmed* නිරායුධ අනාගත වක්තෘ හා *The Prophet Outcast* පිටුවහල්ගත අනාගත වක්තෘ) පිටු අතරින් මතුවී ආ ට්‍රොට්ස්කිගේ වික්‍රමාන්විත ප්‍රතිරූපය කෙලෙසීමට සර්විස් සැදී පැහැදී සිටියේය. එම කෘතීන්, 1960 ගනන් වල පෙරලිකාරී වූ තරුන පරම්පරාවක් මත සැලකිය යුතු බලපෑමක් ඇති කලේය. සර්විස්ගේ අරමුන වූයේ ට්‍රොට්ස්කි දේශපාලන චරිතයක් ලෙස පමනක් නොව මිනිසෙකු වශයෙන් ද අපකීර්තියට පත්කිරීමයිඃ ඔහු අකෘතඥ පුතෙකු, විශ්වාසය කඩකල හා සල්ලාල ස්වාමි පුරුෂයෙකු, නිර්දය හා ලෙන්ගතු කමක් නැති පියෙකු, නාහෙට නොඅහන, කඩාකප්පල්කාරී හා අවිශ්වාස සහගත සහෝදරයෙකු හා අවසාන වශයෙන් ජන ඝාතකයෙකු ලෙස හුවා දැක්වීම ය. භීෂනයෙන් තෘප්තියට පත්වන මිනිසෙකු ලෙසය. (*Trotsky* ට්‍රොට්ස්කි, 497 පිටුව) කෙටියෙන් කිවහොත් විසිවන සියවසේ දේශපාලන ඉතිහාසයේ රකුසෙකු ලෙස ට්‍රොට්ස්කි නිරූපනය කිරීමයි. යුදෙව් විරෝධීන් ප්‍රමෝදයට පත් කිරීමට අසමත් නොවන ආකාරයෙන්, ට්‍රොට්ස්කිගේ යුදෙව් පෙලපත සමඟ සර්විස්ගේ කුලප්පු සහගත බැඳීම ද මම ප්‍රශ්නයට බඳුන් කලෙමි.

ට්‍රොට්ස්කිගේ පුද්ගලික ජීවිතයට සර්විස් එල්ල කරන අපහාසය සවිස්තරාත්මකව හෙලිදරව් කිරීමට අවධානය යොමුකල මාහට ට්‍රොට්ස්කිගේ දේශපාලනය හා අදහස් කෙරෙහි සර්විස්ගේ සැලකීම පිලිබඳව පරීක්ෂා කිරීමට තිබූ කාලය සීමා කලේය. කෙසේ වෙතත් සර්විස්, ට්‍රොට්ස්කි ලිව්වේ, කිව්වේ හා ඒ අනුව කලේ කුමක්දැයි විමසා බැලීමට විශේෂ උනන්දුවක් තමාට නොතිබුනේ යයි ප්‍රකාශ කල බව මා පෙන්වා දිය යුතුය. ඔහු අපේක්ෂා කලේ, ට්‍රොට්ස්කිගේ "වැලලූ ජීවිතය හාරා බැලීමට" යයි සර්විස් ලියා ඇත. (4 පිටුව) "ට්‍රොට්ස්කි නොතකාහලේ කුමක් ද, ඔහු කථා කිරීමට හෝ ලිවීමට තෝරාගත්තේ කුමක් ද යන්න ගැන" තමා උනන්දුවක් දැක්වූ බව සර්විස් කියා සිටියේය. සර්විස්ට අනුව, ට්‍රොට්ස්කි "කථා නොකල මූලික අභ්‍යුපගමයන් ඔහුගේ ජීවිතයේ සංයුතියට අත්‍යන්තයෙන් බැඳී තිබුනි" (5 පි)

වානිජ්‍ය හා දේශපාලනික යන සර්විස්ගේ අරමුනු දෙකටම මෙම ප්‍රවිෂ්ටය මනාව ගැලපුනි. පලමුව, මේ මඟින්, ට්‍රොට්ස්කිගේ ප්‍රකාශිත හා අප්‍රකාශිත ලේඛනවල සුවිශාල උරුමය තුලින් ක්‍රමානුකූල අධ්‍යයනයක යෙදීම කෙසේ වෙතත්, ඔහුගේ ප්‍රධාන කෘති කියවීමේ කරදරයෙන් සර්විස් නිදහස් කලේය. ඔහු එවැන්නක යෙදීමට සිතා සිටියත්, මෙන පැත්තකින්වත් සර්විස්ට බැරෑරුම් පර්යේෂනයක නිරතවීමට හැකියාවක් තිබුනේ නැත. ට්‍රොට්ස්කි පිලිබඳ ඔහුගේ චරිතාපදානය රචනා කලේ, ඔහුගේ ප්‍රකාශකයන් (බ්‍රිතාන්‍යයේ මැක්මිලන් හා එක්සත් ජනපදයේ හාවඩ් විශ්ව විද්‍යාලය) සමඟ එලඹ තිබුනු ව්‍යාපාරික සූත්‍රයකට අනුකූලවය. ට්‍රොට්ස්කි චරිතාපදානය, යන්තම් වසර පහක කාල පරාසය තුල සර්විස් විසින් වෙලඳ පොලට ඉදිරිපත් කරනු ලැබූ තෙවැනි විශාල ග්‍රන්ථයයි. ස්ටැලින්ගේ චරිතාපදානයක් වූ පලමුවන පොත 2005 වසරේ ප්‍රකාශයට පත් කරන ලදී. එහි පෙල පිටු 604 කින් සමන්විතවූ අතර, කොටස් පහකට මනාව ගොනුකර තිබුනි. එක් එක් කොටසකට, පිටු 10-13 අතර ප්‍රමානයේ පරිච්ඡේද 11 අඩංගු විය. ඉන් දෙවසරකට පසුව 2007 දී සර්විස්ගේ දෙවන පොත වූ සහෝදරවරු (*comrades*) එලිදැක්වින. එය, ලෝක කොමියුනිස්ට්වාදයේ බලයලත් ඉතිහාසයක් ලෙස වෙලඳ පොලට පැමිනි අතර කොටස් හයකින් පෙලගස්වා තිබුනු මෙම වෙලුමට පිටු 482 ක් අඩංගු විය. එක් පරිච්ඡේදයක් පිටු 10-12 අතර ගනනකින් සැදුම්ලත් අතර එක් කොටසකට පරිච්ඡේද හයක් අතුලත් විය.

'සහෝදරවරු' දේශපාලනික හා බුද්ධිමය ඉතිහාසය අතින් විකාරයකි. වෙලුමෙහි සර්විස්ගේ හැඳින්වීම මාක්ස්වාදයේ ප්‍රභවයන්ට උඩින් පැනයන මොන්ටි පයිතන් නමින් හැඳින්වෙන විකාර විකට රචනාවලියේ පරිච්ඡේදයක් බඳුය. වෙනත් දේවල් ද අතර සර්විස් සිය පාඨකයන්ට දැනුම් දෙන්නේ, "හේගල් ඔලුවෙන් හිටවූ බව මාක්ස් කියා සිටින්නේය" යනුවෙන් හා ඔහු කිසි විටෙකත්, පෞද්ගලික ව්‍යවසාය පිලිබඳ රිකාඩෝගේ උපදේශකත්වයට සමාවක් නොදුන්නේය" යනුවෙනි. දර්ශනවාදය හා දේශපාලන ආර්ථිකය සමඟ මෙතරම් කඩිනමින් ගනුදෙනු කිරීමෙන් අනතුරුව සර්විස් කියා සිටින්නේ, "කල්ප විනාශයට පසුපසින් එන දිව්‍යලෝකය පිලිබඳ සිහිනය ප්‍රකාශකිරීම මාක්ස්වාදයට තීරනාත්මක විය. මෙම වර්ගයේ චින්තනය පවත්නේ යුදෙව්වාදයේ, ක්‍රිස්තු ධර්මයේ හා ඉස්ලාම් ආගමේය." (14 පි) විශිෂ්ඨ ලෙස කල්පනාකාරී

එවන් නිරීක්ෂන බොහොමයක් සමඟින් මෙම වෙලුම දිදුලයි.

සර්විස් ඉන්පසුව ඔහුගේ ඊලඟ කර්තව්‍යයට අත ගැසීය. 2009 වසරේදී *Trotsky* (ට්‍රොට්ස්කි) ප්‍රකාශයට පත් කිරීමත් සමඟ සර්විස් හා ඔහුගේ ප්‍රකාශකයෝ, ව්‍යාපාරික කාල සටහන හා අන්තර්ගතය නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය අතර නියම සමතුලනයක් අත්කර ගත්හ. පිටු 501 න් යුත් පෙලකින් සමන්විත *Trotsky* ට්‍රොට්ස්කි, කොටස් හතරකට ගොනුකර ඇත. එක් කොටසකට පරිච්ඡේද 13 ඇතුලත්ය. එකක 9-10 අතර පිටු අඩංගුවන පරිච්ඡේද 52 එහි ඇතුලත්ය. සතියකට එක පරිච්ඡේදයක් බැගින් ලියා වසරක් ගතවන විට ලිවීම අවසන් කිරීමට සර්විස් අදිටන් කරගෙන සිටියේ යයි යමෙකුට සාධාරන ලෙස සිතාගත හැකිය. සංස්කරනය, සෝදුපත් බැලීම, යතුරු ලියනය හා මුද්‍රනය සඳහා අමතර මාස ගනනක් අවශ්‍ය වන්නේ යයි සලකන කල, දෙපාර්ශවයේ කාල සටහන කියවා බැලීමට, සැසඳීමෙන් ලේඛන යලි අගැයීමට හා සිතාබැලීමට සර්විස්ට වැඩි කාලයක් ඉතිරිවිය නොහැකිය. ඔහුගේ චරිතාපදානයේ මවිතකරවන සංඛ්‍යාවක් පරිසිද්ධිමය වැරදි තිබීමේ එක් පැත්තක් මෙයින් පැහැදිලි කෙරෙයි.

කෙසේ වෙතත් සර්විස් වැඩ කලේ තරමක් නිස්කලංක කාල සටහනක් සමඟ වූයේ නම් පවා, බොහෝ දුරට ප්‍රතිපලය එයම වනු ඇත. සර්විස් භාරගෙන තිබුනේ, එහි ස්වභාවයෙන්ම ට්‍රොට්ස්කිගේ ලේඛන හා අදහස් සමඟ මූලධර්මාත්මක හා කල්පනාකාරී සහවාසයක් වලකාලන, ට්‍රොට්ස්කි විරෝධී හා ප්‍රති ට්‍රොට්ස්කිවාදී කෙටේරියක් සම්පාදනය කිරීමේ වැඩකි. ට්‍රොට්ස්කිගේ ලියවිලි නොතකා හැරීමෙන් ඔහුගේ අදහස් විකෘති කිරීමට ඉඩ සැලසුනි. සර්විස් සම්බන්ධයෙන් සලකන කල, කුමන හෝ ප්‍රකාශයක සත්‍ය අසත්‍ය තාවය නැත්නම්, එක් හෝ තවත් විනිශ්චයයක් විශ්වාසනීය සාක්ෂි මත පදනම් වූයේ ද යන්න, ඔහුට කරදර වීමට තරම් කාරනයක් නොවීය. ට්‍රොට්ස්කි ගැන ලියන විට මොන අභූතයක්වත් ඕනෑවට වඩා විකාර රූපී නොවීය.

ට්‍රොට්ස්කි 20 වන සියවසේ ශ්‍රේෂ්ඨ විප්ලවවාදී බුද්ධිමතෙක් වීය යන ප්‍රකාශය, ඔහුගේ දේශපාලනය ගැන කිසිදු ලැදියාවක් නොතිබූ අය ද ඇතුලු බැරෑරුම් ඉතිහාසඥයන් විසින් අභියෝග කරන්නක් නොවීය. අවිවාදිතවම ඔහු, අසාමාන්‍ය බලයක් පෙන්නුම් කල ලේඛකයෙකි. තමන්ගේ ලේඛනයේ බලයෙන් ලෝකයේම අවධානය යොමුකරගත් ඔහු, දුර්ලභ ගනයේ දේශපාලඥයෙකි. බලය පිලිබඳ සියලු සම්ප්‍රදායික ආයිත්තම් වලින් වෙන්වූ, තුර්කියේ ඉස්තාන්බුල් වෙරලෙන් ඔබ්බෙහි දිවයිනක ද පසුව ප්‍රන්සයේ හා නෝර්වේහි ප්‍රාදේශීය ගම්වල ද අවසානයේ මෙක්සිකෝ නගරබඳව ද හුදෙකලා පිටුවහලේ ජීවත්වූ ට්‍රොට්ස්කිගේ වචන, ලෝක මතය කෙරෙහි බලපෑවේය.

ඔහුගේ සතුරෝ ඔහු කෙරෙහි දැක්වූයේ භීතියකි. ඔහුගේ නම සඳහන්කල පමනින් හිට්ලර් වියරු වැටුනි. සිය අනසක යටතේ භීෂනයේ දැවැන්ත යාන්ත්‍රනයක් සහිතව ක්‍රෙම්ලිනයට අරක්ගෙන සිටි බලගතු ස්ටැලින් පවා ට්‍රොට්ස්කිට බිය විය. ස්ටැලින්ගේ පෞද්ගලික ලේඛනාගාරයට ප්‍රවිෂ්ටය සහිත සෝවියට් ඉතිහාසඥයෙකුවූ නැසීගිය ජෙනරාල් දිමිත්‍රි වොල්කොගනොව් මෙසේ ලිවීය. "ට්‍රොට්ස්කි පිලිබඳව හෝ ට්‍රොට්ස්කි විසින් ලියන ලද හෝ සෑම දෙයක්ම පාහේ ඔහු වෙනුවෙන් පරිවර්තනය කොට පිටපත ස්ටැලින් අතට පත්කරන ලදී. ඔහුගේ කාර්යාලයේ විශේෂ අල්මාරියක් තුල, දැඩි වෛරයකින් යටින් ඉරි ඇඳි හා අටුවා සහිත ට්‍රොට්ස්කිගේ කෘති සියල්ලම වාගේ ඔහු තබාගෙන සිටියේය. බටහිර මාධ්‍ය වෙත ට්‍රොට්ස්කි දුන් කුමන හෝ සම්මුඛ සාකච්ඡා හෝ කල ප්‍රකාශ වහාම පරිවර්තනය කර ස්ටැලින් අතට පත් කෙරුනි." (1)

> "ට්‍රොට්ස්කිගේ අවතාරය නිරතුරුවම බල ලෝභියාගේ (ස්ටැලින්ගේ) සිතෙහි හොල්මන් කරමින් ඔහු බියපත් කලේය. මොලටොව්, කගනොවිච්, කෘෂෙව් හා ෂඩනොව් සමඟ වාඩිවී කතාබස් කරන විට ඔහු ට්‍රොට්ස්කි ගැන සිතුවේය. සංවිධානය ග්‍රහනයකර ගැනීම හා ලේඛකයෙක් මෙන්ම කථිකයෙක් වශයෙන් ගත්කල ට්‍රොට්ස්කි, සුවිශේෂී බුද්ධිමය ඥානයකින් හෙබි අයෙක් විය. සෑම අතකින්ම ඔහු, මෙම නිලධරයන් රොත්තට වඩා බෙහෙවින් ප්‍රමුඛ විය. ඔහු ස්ටැලින්ට වඩා ප්‍රමුඛ වූ අතර ස්ටැලින් ඒ බව දැන සිටියේය. *The Stalinist School of Falsification* මුසාකරනයේ ස්ටැලින්වාදී ගුරුකුලය, *An Open Letter to the Members of the Bolshevik Party* බොල්ශෙවික් සාමාජිකයන් වෙත විවෘත ලිපියක් හෝ *The Stalinist Thermidor* ස්ටැලින්වාදී තර්මිඩෝරය වැනි ට්‍රොට්ස්කිගේ කෘතියක් කියවන විට නායකයා මුලුමනින්ම පාහේ වෙව්ලා ගියේය." (2)

ට්‍රොට්ස්කිගේ මරනයෙන් සැත්තෑ වසරකට පසුව ද ඔහුගේ කෘතීන්, ලොව පුරා විවිධ භාෂාවන්ගෙන් පලවෙමින් තිබේ. සමහරවිට මාක්ස් හා එංගල්ස් හැරුනු කොට, සැබවින්ම සම්භාව්‍ය මාක්ස්වාදයේ සියලු ප්‍රමුඛ නියෝජිතයන් අතරින් වඩාත්ම පුලුල් ලෙස කියවා ඇත්තේ ට්‍රොට්ස්කිය. ට්‍රොට්ස්කිගේ නාමය හා බැඳී තිබෙන *Revolution Betrayed* විප්ලවය පාවාදෙයි, *uneven and combined*

*development* අසමාන හා ඒකාබද්ධ වර්ධනය, *Permanent Revolution* නොනවතින විප්ලවය හා *Fourth International* හතරවන ජාත්‍යන්තරය යන වචන නූතන ඉතිහාසයේ දේශපාලන අත්දැකීම් පිලිබඳ ප්‍රධාන රටාව සිහිගන්වයි. රුසියානු විප්ලවය තවත් පරම්පරා ගනනාවකට කුතුහලය දනවන, මතභේදාත්මක හා අවේගශීලී මාතෘකාවක් ලෙස පවතිනාතාක් දුරට, සිහිවටනයක් වන ට්‍රොට්ස්කිගේ *History of the Russian Revolution* රුසියානු විප්ලවයේ ඉතිහාසය, පාඨකයින්ගේ බුද්ධිය, සංකල්පනය හා ආවේගයන් ඇද බැඳගන්නා කෘතියක් ලෙස පවතිනු ඇත. ට්‍රොට්ස්කි පැහැදිලිවම ප්‍රධාන දේශපාලන චින්තකයෙකි. ට්‍රොට්ස්කිවාදියෙකු නොවූවත්, සමකාලීන ඉතිහාසඥයෙකු වන බරුක් නේයි පැෂ්, ට්‍රොට්ස්කිගේ චින්තනය පිලබඳව 1978 කල අධ්‍යයනයකදී විය යුතු පරිදිම මෙසේ ලිවීය.

> බලයේ සිටියදීත් බලයේ නොසිටියදීත් ට්‍රොට්ස්කිගේ ජීවිතයෙහි විප්ලවවාදී කාර්ය සාධනය පිලිබඳව බොහෝදේ ලියා තිබෙන නමුත් ඔහුගේ සමාජ හා දේශපාලන චින්තනය ගැන ලියවී ඇත්තේ සාපේක්ෂව සුලු වශයෙනි. සමහර විට ඔහුගේ ජීවිතය, බොහෝ ත්‍රාසජනක අවස්ථාවන්ගෙන් පිරී තිබුනු තතු හමුවේ එවැන්නක් සිදුවීමට ඉඩ තිබුනු අතර අද දින පවා සමහර විට අහේතුක නොවන, විප්ලවකාරී පුද්ගලයන් හිග නොවූ යුගයක සිටි ශ්‍රේෂ්ඨතම විප්ලවවාදියා ලෙස ඔහු සැලකිය යුතු වෙයි. එසේ වුවත්, න්‍යාය හා අදහස් ක්ෂේත්‍රයේ ඔහුගේ ජයග්‍රහන, බොහෝ පැතිවලින් විශිෂ්ඨත්වයෙන් අඩු නොවේ. විසිවන සියවසේ පසුගාමී සමාජයන්හි සමාජ පරිවර්තනයේ ඉස්මතු වීම විශ්ලේෂනය කල පලමුවැන්නන් අතරට ඔහු ගැනෙයි. එසේම එවන් වෙනස්කම් වලින් අවිචල්‍ය ලෙස හිස ඔසවන දේශපාලන ප්‍රතිවිපාක පැහැදිලි කිරීමට උත්සාහ කල අය අතර ද පලමුවැන්නා ඔහු විය. සිය ජීවිත කාලය තුල ඔහු බහුවිධ ග්‍රන්ථ රචනාකර ඇති අතර ඔහු තුල සිටි දේශපාලන චින්තකයා, වඩාත් හොඳින් දන්නා ක්‍රියාකාරිත්වයේ මිනිසාට වඩා ඔහුගේ අවේනික පෞරුෂයේ අඩු කොටසක් නියෝජනය කලේ නැත. (3)

දැන් අපි සර්විස්ට සවන් දෙමු. "ඔහු (ට්‍රොට්ස්කි) සෑම විටම තම සිතට නැගුනු කුමක් හෝ ලිව්වේය." (78 පි) ට්‍රොට්ස්කි "බුද්ධිමය අපූර්වත්වයකට හිමිකම් නොකීවේය: එසේ කිරීමට උත්සාහ කලේ නම් ඔහු පරිහාසයට ලක්වීමට ඉඩ තිබුනි." (109 පි) "ඒ වනවිට පක්ෂයේ බුද්ධිමය පැලැන්තියට වඩ දෙමින් තිබුනු බොහෝ ප්‍රශ්න ගැන පර්යේෂන කිරීමට කරදරවීම ඔහු ප්‍රතික්ෂේප කලේය..." (109 පි) "බුද්ධිමය වශයෙන් ඔහු මාතෘකාවෙන් මාතෘකාවට ලුහුටා ගියේය." (110 පි) "හුදෙක්ම ඔහු ඇලුම් කලේ, උල්පත් පැනක් අතැතිව මේසයක් වටා හිඳිමින් අලුත්ම ප්‍රවෘත්ති කුරුටු ගෑමටය." (319 පි) "ඔහුගේ සිතුවිලි ව්‍යාකූලය, එසේම ව්‍යාකූල කරවන වැරහැලි මල්ලකි." (353) "ඔහු බොහෝ කාලයක් ගත කලේ වාද කරමින්ය, සිතීමට ගත කලේ අඩු කාලයකි....මෙය පිටුපස පැවතියේ, බුද්ධිමතෙක් ලෙස ගාම්භීරත්වයේ අත්‍යන්ත හිගයකි." (356 පි) "ඔහුගේ ලේඛන මනෝරාජික ප්‍රස්තාරවලින්, චපල තර්කනයෙන් හා නොසැලකිලිමත් සටන්පාඨ වලින් ගහන විය." (397 පි)

යමෙක් එවන් ඡේද කියවන විට, ඒවායේ අමු මුග්ධත්වයෙන් හා ගොරහැඩි භාවයෙන් සරලවම විශ්මයට පත්වෙයි. ඒවායේ කතුවරයා, එවන් මනස්ගාත බැරෑරුම් ලෙස සැලකිල්ලට ලක්වනු ඇතැයි බලාපොරොත්තු වන්නේ ද? ඔහුම පවා ඒවා විශ්වාස කරයි ද? සර්විස්, ට්‍රොට්ස්කිගේ "අදහස්වල ව්‍යාකූල හා ව්‍යාකූල කරවන වැරහැලි මල්ලක්" පිලිබඳ කිසිදු නිදසුනක් සපයන්නේ නැත. ට්‍රොට්ස්කි විසින් කරන ලද එකම කෘතියක් ගැන විමසා බැලීමට හෝ ඒ පිලිබඳව ප්‍රමානවත් සාරාංශයක් ඉදිරිපත් කිරීමට පවා සර්විස් උත්සාහ නොගනියි. ඉහතින් සඳහන් කල ආකාරයේ වර්ගීකරන, මුල් කෘතීන්ගෙන් උපුටා දැක්වීමෙන් හෝ ඒවා පිලිබඳ කිසිදු විමර්ෂනයකින් හෝ තොරව එහෙන් මෙහෙන් ඇහිඳගත් ඒවාය. නොනවතින විප්ලවයේ න්‍යාය හා පිරිහුනු කම්කරු රාජ්‍යයක් ලෙස සෝවියට් සංගමයේ සමාජ ආර්ථික පදනම් පිලිබඳ ඔහුගේ විශ්ලේෂනය වැනි ට්‍රොට්ස්කි සමඟ බැඳුනු වඩාත් වැදගත් සංකල්ප පවා පැහැදිලි නොකරයි. ට්‍රොට්ස්කිගේ නිශ්චිත කෘතීන් ගැන කරන කෙටි සඳහන්වල දුරට පවා එසේ කර ඇත්තේ, ඒවායේ කතුවරයා හා ඔහුගේ අදහස් හාස්‍යයට ලක් කිරීමේ අදහසින් ගනන් බලා සිදුකල ආකාරයෙනි.

ට්‍රොට්ස්කිට එරෙහිව මෙවන් උපක්‍රම යොදාගත් පලමුවැන්නා සර්විස් නොවේ. සත්තකින්ම ඔහුගේ ක්‍රමවේදය, සෝවියට් නිලධරය හා ඊට බැඳුනු මහා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට් පක්ෂය වැනි ස්ටැලින්වාදී පක්ෂ විසින්, 1960 ගනන්වල අග භාගයේ ද 1970 ගනන්වල මුල ද දියත් කල ජාත්‍යන්තර ප්‍රති ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය යොදාගත් විධික්‍රමයන්ට කැපී පෙනෙන සාම්‍යයක් දරා සිටියි. එම අවධියේ සෝවියට් ඉතිහාසය ඉගෙන ගනිමින් සිටි තරුන උපාධි අපේක්ෂකයෙක් ලෙස සර්විස් මහතා, මෙම ව්‍යාපාරය පිලිබඳව දැන නොසිටින්නට ඉඩක් නැත. බ්‍රිතාන්‍ය කොමියුනිස්ට පක්ෂයේ ප්‍රති ට්‍රොට්ස්කිවාදී විශේෂඥවරියක් වූ ස්ටැලින්වාදී බෙටී රීඩ්ගේ ලියවිලි, බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාල තුල එවකදී පුලුල් ලෙස බෙදාහරින ලදී. එම වසරවල, පෙරලිකාරී තරුනයන්

අතර ට්‍රොට්ස්කිවාදයේ බලපෑම පැතිරයාම පිලිබඳව සෝවියට් නිලධරය වඩ වඩාත් කනස්සල්ලට පත්වූහ. 1956 කෘෂෙව්ගේ හෙලිදරව්කිරීම් මගින් ස්ටැලින්ගේ අපරාධ ඒ වන විටත් අපකීර්තියට පත්ව තිබූ තතු හමුවේ, 1930 හා 1940 ගනන්වල මෝස්තරයක් බවට පත්ව තිබූ ට්‍රොට්ස්කි "ෆැසිස්ට් කඩාකප්පල්කාරයෙක්" යයි සරල ලෙස හෙලා දැකීම පමනක් ක්‍රෙම්ලිනයේ දෘෂ්ටිවාදීන් හට තවදුරටත් ප්‍රමානවත් වූයේ නැත. ද්‍රෝහී මුසාකරනයේ වෙනත් මාදිලීන් සොයාගත යුතුව තිබුනි. විශේෂයෙන්ම ට්‍රොට්ස්කිගේ ලියවිලි, අභූත හෝ පිස්සෙකුගේ ගෝරනාඩු ලෙස පෙනීයන පරිදි ඉදිරිපත් කරමින් ඒවා අමු අමුවේ විකෘති කිරීම, ට්‍රොට්ස්කිවාදයට එරෙහිව යලි පනපෙවූ ප්‍රහාරය තුල මූලික ක්‍රියාකලාපයක් ඉෂ්ඨ කලේය. සත්තකින්ම, ට්‍රොට්ස්කිගේ අදහස් අපකීර්තියට පත්කිරීමේ උත්සාහයේදී, ඔහුගේ ලියවිලි වලින් උපුටා දැක්වීම අවමකර තබාගැනීම අවශ්‍ය විය. ප්‍රකට ඇමරිකානු ශාස්ත්‍රඥයෙක් වූ නැසීගිය රොබට් එම්. මැක්නීල් විසින් 1977 දී ලියන ලද "සෝවියට් ප්‍රති ට්‍රොට්ස්කිවාදයේ පුනර්ජීවය" යන හිසින් යුත් වැදගත් ලේඛනයක් තුල, ස්ටැලින්වාදයේ ක්‍රමවේදය මෙසේ විස්තර කොට තිබේ.

> සෝවියට් ප්‍රති ට්‍රොට්ස්කිවාදයේ පුනර්ජීවනය කල සංස්කරනය තුල සඳහන්කල නොහැකි බොහෝ දේ තිබේ. ඔහුගේ ලේඛන පූර්න ග්‍රන්ථාවලියක රූපයෙන් මෙන්ම නිරන්තරයෙන් ද සඳහන් කල නොහැකිය. අතිරේක ප්‍රකාශන තොරතුරු කිසිවකින් තොරව, *Permanent Revolution* and *My Life* (නොනවතින විප්ලවය හා මගේ ජීවිතය) වැනි ග්‍රන්ථ නාමයන් සාපේක්ෂව සුලභ වශයෙන් සඳහන් කරනු යමෙකුට දැකගත හැකි වුවත්, වෙනත් දේ දැකගත හැක්කේ ඉතා අඩුවෙනි. මෙය කල්පනාකාරී පූර්වාරක්ෂක පියවරක් විය. විශේෂයෙන්ම ට්‍රොට්ස්කිගේ කෘතීන්ගෙන් අඩුවක් නොමැති පුස්තකාල තිබෙන රටවල පඨකයන් ගැන සලකන කල්හි, කඩාකප්පල්කාරී ලේඛන ලැයිස්තු සැපයීම මඟින් සතුරාට උල්පන්දම් දීම අවශ්‍ය නොවේ. ප්‍රධාන මූලයන් පිලිබඳව ඇතිකරන මේ නොපැහැදිලිකම, ඔවුන්ගේ (ස්ටැලින්වාදීන්ගේ) අර්ථ කථනයට උපකාරී විය. ට්‍රොට්ස්කි සෝවියට් සංගමයට මඩ ගැසුවේ යයි ද එය සමාජවාදී යයි නොපිලිගත් බව ද ඔවුහු අවධාරනය කලහ. එය නිෂ්ප්‍රභා කිරීම අවශ්‍ය නොවන තරම්ම අභූත ලෙස සැලකූ අවධාරනයකි. එහෙත් ස්ටැලින්වාදය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විවේචනයෙහි අන්තර්ගතය කිසිවිටෙකත් පැහැදිලි කලේ නැත. (4)

ට්‍රොට්ස්කිගේ "ලිඛිත උරුමය සමස්ත කථාන්තරය බවට පත්වීමට ඉඩ නොතැබිය යුතු යයි" ද "සමහර අවස්ථාවලදී ඔහුගේ කාර්යසාධනයේ ඉදිරිදර්ශනය වඩාත් සඵල ලෙස ගොඩනැගෙන්නේ මහා ප්‍රසිද්ධ ප්‍රකාශනයන් තුලින් නොව, නොවැදගත් යයි පෙනීගිය රොඩුබොඩු වලින්" (5 පි) යයි ද සර්විස් සටහන් කරයි. ට්‍රොට්ස්කිගේ ප්‍රකාශිත චරිතාපදානය (පූර්වයෙන් පලවූ) ඔහුගේ ජීවිතය පිලිබඳ යථාර්තය සැඟවීමේ වංක උත්සාහයක් බව පැවසීමට සර්විස් ඉදිරිපත්වෙයි. එසේම "අනෙක් අයගෙන් වසංකල යුතු යයි ඔහු සිතූ දේ පිලිබඳව ඡේදනයන් හා සංශෝධන අපට කියා දෙයි." (5 පි) මෙම ප්‍රකාශ, මැක් නීල් විසින් හරියටම හඳුනාගත් ස්ටැලින්වාදයේ විචල්‍යයක් වන, මුසාකරනයේ විධික්‍රමයක නිදසුනක් ගෙනහැර දක්වයි.

ඔහුගේ ලේඛන පුරා පැතිර පවතින දේශපාලන දැක්ම සර්විස් විසින් යොදාගත් ක්‍රමවේදය හා බැඳී තිබේ. ට්‍රොට්ස්කි පිලිබඳ සර්විස්ගේ ද්වේෂය වනාහි, ස්ටැලින් කෙරෙහි ඔහුගේ ඇල්ම විදහා පෙන්වන කැඩපත් ඡායාවයි. ට්‍රොට්ස්කි පිලිබඳ සර්විස්ගේ සමච්චල් සහගත හා උපහාසාත්මක ගුනාංගීකරන විමසා බලන අතරතුර මහාචාර්යවරයාගේ ස්ටැලින් පිලිබඳ අගැයීම අපි සලකා බලමු. 2005 චරිතාපදානය තුල සර්විස් ස්ටැලින් විස්තර කරන්නේ, "රුසියානු භාෂවේ අත්පිටපත් පිලිබඳ අනර්ග සංස්කාරක වරයෙක්" ලෙසය. එහෙත් සර්විස් මෙම අනර්ග සංස්කරනය ප්‍රදර්ශනය කරන එකදු අත් පිටපතක් ගැනවත් සඳහන් කරන්නේ නැත. ආඥාදායකයා ලෙස ස්ටැලින් ඔහුගේ බොහෝ සංස්කරන සිදුකලේ ඝාතකයාගේ මූනිස්සමක් සමඟින් බව ද සර්විස් ඉඟි නොකරයි. ( *Stalin* ස්ටැලින්, 115 පි) ඒ වෙනුවට ප්‍රශංසාව දිගටම කෙරීගෙන යයි. "ශෛලියකට ලියන්නෙක් නොවූවත් ස්ටැලින්, සැබවින්ම ව්‍යක්ත හා කල්පනාකාරී ලේඛකයෙක් විය." සර්විස් එසේ ලියයි. (221 පි) අදහසක් නොව පරිසිද්ධියකි! සර්විස් අපට කියන පරිදි, "තම හිසෙහි ඇති කුමක් හෝ ලියන්නෙකු" වූ ට්‍රොට්ස්කිට වඩා මෙය බෙහෙවින් වෙනස්ය. ඔව්, ස්ටැලින් කොයි අතකින්වත් සම්පූර්න නොවීය. "ඔහු මානසික ග්‍රස්තියකින් පෙලුනු ජන ඝාතකයෙකි." සර්විස් ශෝක හරිතව සඳහන් කරයි. එහෙත්, "ඔහු සිතුවේත් ලිව්වේත් මාක්ස්වාදියෙකු ලෙසය." (379 පි) ඔහුගේ *Foundations of Leninism* ලෙනින්වාදයෙහි පදනම්, "තෙරපුම් සහගත කර්තව්‍යයක්" වූයේය. (221 පි) "ස්ටැලින් කල්පනාකාරී මිනිසෙකු වූ අතර, ඔහුගේ ජීවිත කාලය පුරාම, තමාට දක්නට ලැබුනු විශ්වය හොඳ තැනක් බවට පත්කිරීමට කැපවිය. ඔහු බොහෝ දේ අධ්‍යයනය කල අතර අමතක කලේ ස්වල්පයකි... ඔහු නිසග චින්තකයෙක් නොවූ අතර විශිෂ්ඨ ලේඛකයෙක් පවා නොවීය. එහෙත් ඔහු සිය අවසානය දක්වාම බුද්ධිමතෙක් විය." සර්විස් එසේ ලිවීය. චරිතාපදානය අවසානයේ ස්ටැලින් ගැන ලිවීම නිමා

කරමින් සර්විස් මෙසේ ප්‍රකාශ කරයි. "එහෙත් නිසැකවම ඔහු සුවිශේෂී අයෙක් විය. ඔහු නියම නායකයෙක් විය. ඔහු අදහස් වලින් මෙන්ම බලය සඳහා තන්හාවෙන්ද අභිප්‍රේරනය විය. ඔහු තමාගේම ක්‍රමයේ බුද්ධිමතෙකු වූ අතර ඔහුගේ ශාස්ත්‍රීය හා සංස්කරනමය දක්ෂතා මනබඳින්නේය. ඔහුගේ මානසික හුරු පුරුදු හැම විටම මතභේදාත්මක වනු ඇත." (603 පි)

සිය ට්‍රොට්ස්කි චරිතාපදානය තුල සර්විස්ගේ අරමුන වූයේ, අයිසැක් ඩොයිස්චර් හා ප්‍රන්ස ඉතිහාසඥයෙකුවූ පියරි බෲවේ විසින් ඊට ප්‍රථමයෙන් ලියන ලද චරිතාපදන තුලින් ඉස්මතුවූ හිතකර ප්‍රතිරූපය කෙලෙසීමයි. ස්ටැලින් පිලිබඳ සර්විස්ගේ චරිතාපදානයේ අරමුන, එහි ප්‍රතිවිරුද්ධයයි. සර්විස්ට ට්‍රොට්ස්කිගේ චරිතාපදානය ලිවීම වෛරීව කල කටයුත්තක්වූ අතර ස්ටැලින් මුල්කරගත් ඔහුගේ කෘතිය ඉමහත් ආශාවෙන් ඉටුකල කර්තව්‍යක් විය. ස්ටැලින්ගේ පවත්නා ප්‍රතිරූපය "අභියෝගයට ලක් කල යුතුව තිබුනේ කලකට පෙර" යයි සර්විස් ලිවීය. "මෙම කෘතිය ඉලක්ක කරන්නේ ස්ටැලින්, ගතානුගතිකව සංකල්පනය කලාට වඩා බෙහෙවින් ගතික හා සංකීර්න චරිතයක් වූ බව පෙන්වා දීම කෙරෙහි ය." (*Stalin* ස්ටැලින්, පි. x) ස්ටැලින් "නිලධරයෙක් හා ඝාතකයෙක් වූ" බව සර්විස් පිලිගනියි. එහෙත්, "ඔහු නායකයෙක් හා සංස්කාරකයෙක් ද න්‍යායාචාර්යවරයෙක්, (යම් වර්ගයක) කවියෙක්, (තරුන වයසේදී) කලා රසිකයෙක්, පවුලට ලැදි අයෙක් හා සංසුන් අයෙක් ද විය." (පි. x) හිට්ලර් ගැන නොකීවත්, ගොබෙල්ස් හා ගෝරිං ගැන කිව හැක්කේ ද එයමය.

සමහරවිට සර්විස් සිතා ඇත්තේ, සිය පාඨකයන්ට තමන් පිලිගන්වනු ලබන්නේ ප්‍රතිවිරුද්ධ අංගෝපාංගයන්ගෙන් පදම් කරන ලද සියුම් වෙනසක් සහිත ප්‍රතිරූපයක්ය කියා විය හැකිය. එහෙත් ඔහු සැබවින්ම පිලිගන්වා ඇත්තේ, චිත්‍රපටවල සුලභව දක්නට ලැබෙනනවාටත් වඩා නරක විචල්‍යයකි. එනම්, සමූහ ඝාතකයෙක් සිය දරුවන් ඇඳට යවා සුභ රාත්‍රියක් පතා ඔවුන් සුමුදු ලෙස සිපගැනීමක් වැනි, එහෙත්, ඔහු අපට දායාද කර ඇත්තේ කුමක් ද? සැබවින්ම, අවසාන සෝවියට් නායකයාවූ මිකායෙල් ගොර්බචොව් විසින් 1987 නොවැම්බරයේදී, ඉතිහාසය පිලිබඳව පැවැත්වූ ඔහුගේ කුප්‍රකට කථාවේදී පෙන්නුම් කලාට හරියටම සමාන දේශපාලන ප්‍රතිරූපයකි:

> අපගේ ඉතිහාසය තුල ස්ටැලින්ගේ භූමිකාව පිලිබඳව දැන් බොහෝ සාකච්ඡා පැවැත්වෙමින් තිබේ. ඔහුට තිබුනේ අතිශයින්ම ප්‍රතිවිරෝධී පෞරුෂයකි. ඓතිහාසික සත්‍යයට විශ්වාසවන්ත වෙමින්, සමාජවාදය සඳහා අරගලයටත් එහි ජයග්‍රහන ආරක්ෂා කිරීමටත් ස්ටැලින්ගේ අවිවාදිත ප්‍රතිපදානය ද, අපගේ ජනතාව දැවැන්ත ලෙස වන්දි ගෙවූ හා අපගේ සමාජ ජීවිතයට බරපතල ප්‍රතිවිපාක ගෙනදුන්, අන්ත දේශපාලනික දෝෂ හා ඔහු ද ඔහු වටා සිටියවුන් ද විසින් සිදුකරන ලද අපහරනයන් යන දෙකම අප විසින් දැකිය යුතුව තිබේ.(5)

ස්ටැලින් අපරාධ සිදුකල බව සර්විස් හා ගොර්බචොව් යන දෙදෙනාම පිලිගැනීමට සූදානම්ය. එහෙත් අවධාරනය කෙරෙන්නේ ඔහුගේ සාධනීය ජයග්‍රහනයන්ය. ස්ටැලින් චරිතාපදානයේ පලමු ඡේදය තුල සර්විස් මෙසේ කීවේය. "සෝවියට් සමූහාන්ඩුව ගොඩනගනු ලැබුවේ ලෙනින් නමුත්, එහි ව්‍යුහය තීරනාත්මකව ශක්තිමත් කර ස්ථාවර කරන ලද්දේ ස්ටැලින් විසින්ය. ස්ටැලින් නොමැතිවූයේ නම් සෝවියට් සංගමය 1991 විසිරුවා හැරීමට දශක ගනනාවකට පෙරම, බිඳවැටිය හැකිව තිබුනි." (*Stalin* ස්ටැලින්, 3 පි.) මෙහි තේරුම නම් ස්ටැලින් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ ව්‍යුහය තීරනාත්මකව ශක්තිමත් කලේය; ස්ථාවර කලේය. ඔහු නොසිටින්නට 1991ට වඩා දශක ගනනාවකට පෙර එය බිඳවැටිය හැකිව තිබුනි. මේවා වනාහී සෝවියට් සංගමයේ පොලිට් බියුරෝ සාමාජිකයෙකු විසින් වුවද පැවසිය හැකි වදන්ය! ස්ටැලින්ගේ ප්‍රතිපත්ති වෙනුවෙන් මීටත් වඩා ප්‍රබල ක්ෂමාලාපයක් හා යුක්තිකරනයක් ගැන සිතීමටවත් පුලුවන් ද?

එම වචන සමඟ ස්ටැලින්ගේ සියලු ක්‍රියා හා අපරාධ සහේතුක හා නීතියුක්ත කෙරේ: 1920 ගනන්වල වාමාංශික විරුද්ධ පක්ෂය තලා දැමීම, සාමුහිකකරනයේ භීෂනයන්, මොස්කව් නඩු හා 1930 ගනන් අග භාගයේ භීෂනය, යුරෝපය තුල ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනයන්ට ඉඩ සැලසූ අවමංගතකිරීම් හා පාවාදීම්, 1941 ජූනි මාසයේ ජර්මානු ආක්‍රමනයෙන් පසුව, මිලියන ගනනක් සෝවියට් ජීවිත නිකරුනේ විනාශ වීමට මඟ හෙලිකල 1937-38 වසරවල රතු හමුදාවේ නායකත්වයෙහි හිස සිඳීම හා ස්ටැලින් හිට්ලර් ගිවිසුම, සෝවියට් ආර්ථිකයේ දූෂ් කලමනාකරනය හා රටේ බුද්ධිමය ජීවිතයේ අඥානකම්, එරට විශිෂ්ඨතම ලේඛකයන්, දාර්ශනිකයන්, විද්‍යාඥයන් මරාදැමීම, යුදෙව් විරෝධය යලි පනගැන්වීම හා සෝවියට් සංගමය තුලත් ජාත්‍යන්තරවත් මාක්ස්වාදී හා සමාජවාදී පරමාදර්ශ කෙලෙසීම යන සියල්ල සෝවියට් සංගමයේ ස්ථාවරත්වය හා සුරක්ෂිතභාවය සඳහා වූ බව සලකන සර්විස්, ඒවා නීතියුක්ත කරයි! සර්විස්, ස්ටැලින් විසින් ඉතිරිකර තැබූ ව්‍යුහය අර්බුදයෙන් අර්බුදයට ඇදී යාමේ හා ඔහුගේ භාරකාරත්වය යටතේ බලයට නැගීගත් නිලධරයන්ගේ පරම්පරාවක්, සෝවියට් සංගමය එකතැන පල්වෙන හා බිඳවැටෙන තත්වය තුල නායකත්වයේ රැඳී සිටීමේ කාරනයට උඩින් පැන යයි.

ත්‍රස්තය, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය මුහුනපෑ තර්ජනයන්ට ස්ටැලින් දැක්වූ

යුක්තිසහගත ප්‍රතිචාරයක් බව අඟවනතාක් දුරට සර්විස් ගමන් කරයිඃ

> ආරක්ෂාවට ඔහුගේ සලකාබැලීම් අතර ප්‍රමුඛස්ථානය හිමිවිය. ඔහුගේ පුද්ගලික ආරක්ෂාව හා ඔහුගේ ප්‍රතිපත්ති ද නායකත්වය හා රාජ්‍ය ද අතර කිසිදු විලක්ෂනයක් ඔහු සිදු නොකලේය. මොලටොව් හා කගනොවිච් පසුකාලයකදී කියා ඇත්තේ, යුද්ධයක් වැනි අවස්ථාවකදී ආක්‍රමනික හමුදාවන්ගේ සහායට පැමිනිය හැකි "පස්වන සේනාංකයක්" පිලිබඳ සාධාරන බියක් ස්ටැලින්ට තිබුනු බවයි. ස්ටැලින් ද මෙවැනිම ඉඟි පලකලේය. 1936 ජූලි මාසයේ හටගැනුනු ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ දී පහසුවෙන්ම අනුගාමිකයන් සොයාගැනීමට ජෙනරාල් ෆ්‍රැන්කෝට හැකියාව ලැබී තිබීම ගැන ඔහු කම්පනයට පත්විය. කවරදාකවත් සෝවියට් සංගමය තුල එවැන්නක් ඇතිවීම වැලැක්වීම ඔහුගේ අදිටන විය. රාජ්‍ය ත්‍රස්තයේ පලදායීත්වය කෙරෙහි විශ්වාසය තැබූවෙක් ලෙස ඔහු, 1937-38 වසරවල උත්සන්න ප්‍රචන්ඩත්වයට යොමු වූයේ මන් ද යන්න එවන් සිතිවිලි මඟින් යම් දුරකට පැහැදිලි කරයි. (*Stalin* ස්ටැලින්, 347-48 පිටු)

1930 ගනන්වල දහස් ගනන් ඝාතනයන්ට නියෝග දුන් අයගේ ලැයිස්තුවට තමන්ගේ නම් එකතුකරගත් ස්ටැලින්ගේ සම අලුගෝසුවන් වන මොලටොව් හා කගනොවිච් විසින් ත්‍රස්තය සඳහා ලබාදුන් බොරු යුක්තිකරනයන් විශ්වාස කටයුතු යයි සර්විස් පිලිගනියි. බොල්ශෙවික් පැරනි නායකත්වය හා විප්ලවකාරී සමාජවාදී බුද්ධිමතුන්ගේ පුලුල් කොටස්වල ගෙල සිඳ දමීමේ ස්ටැලින්ගේ තීන්දුව හා, සෝවියට් රාජ්‍යයට එරෙහිව දක්ෂිනාංශික කුමන්ත්‍රනයක් සූදානම් කෙරෙමින් තිබීම පිලිබඳ "සාධාරන බියක්" සමඟ කිසිදු සම්බන්ධයක් පිලිබඳ මොනම සාක්ෂියක් හෝ ඇත්තේ නැත. අන්ත දක්ෂිනාංශය සමඟ අනන්‍යවූ ප්‍රකට හමුදා නිලධාරීන් රිපබ්ලිකන් ආන්ඩුවට එරෙහිව කුමන්ත්‍රනයක් දියත් කල ස්පාඤ්ඤයේ සිදුවීම්, ස්ටැලින්ට ත්‍රස්තය දියත් කිරීමට පෙලඹීම් කල බව ඇඟවුම් කිරීමෙන් සර්විස්, මොස්කව් නඩුවිභාග වලදී පැරනි බොල්ශෙවික් විත්තිකරුවන්ට එරෙහිව රාජ්‍යයේ අභිචෝදක විෂින්ස්කි විසින් එල්ල කල බිහිසුනු චෝදනා වලට නීත්‍යානුකූල බවක් පවරයි. 1936 ජූලියේදී ස්පාඤ්ඤ සිවිල් යුද්ධය හටගත් වකවානුවට වඩා, පැරනි බොල්ශෙවිකයන් කායිකව වනසා දැමීම සඳහාවූ සැලසුම් ඉතා ඉහල තලයක පැවති බව පෙන්වා දිය යුතුය. කිරොව් ඝාතනය සිදුවූයේ 1934 දෙසැම්බරයේ දීය. සිනොවියෙව්, කමනෙව් හා ගිනිය නොහැකි තවත් අය 1935 වසරේ පටන් සිරගතකොට තිබුනි. පාපෝච්චාරන ගැනීම සඳහා වධදීම් ද ඇතුලුව දැඩි පීඩාවන් යටතේ තබා සිටි සිනොවියෙව්, කමනෙව් හා සිරගතකොට සිටි අනෙකුත් නම් කිරීමට හැකි විත්තිකරුවන්ට එරෙහිව පලමු මොස්කව් නඩු සඳහා සූදානම මාස ගනනාවක් තිස්සේ සිදුකෙරෙමින් පැවතුනි. සිය පැරනි සහෝදරවරුන් අතුගා දැමීමේදී ස්ටැලින් "පෙලඹවූ" කිසියම් විදේශ බලපෑමක් තිබුනේ නම් ඒ, ස්පාඤ්ඤයේ දක්ෂිනාංශික කුමන්ත්‍රනය නොවීය. ඊට පටහැනි ලෙස එය, 1934 ජූනි මාසයේ ජර්මනිය තුල "දිගු පිහියාවල රාත්‍රිය" ලෙස හැඳින්වූ, එස්ඒ කඩාපනින හමුදාවේ නායකත්වයෙහි සිටි සිය පක්ෂයේ පැරනි සහකරුවන් හිට්ලර් විසින් ඝාතනය කිරීමයි.

ස්ටැලින් භීෂනය දියත් කලේ ඔහුගේ තන්ත්‍රයට එල්ලවී තිබුනු තර්ජනයන් සමඟ ගනුදෙනු බේරාගැනීමටය යන්න සත්‍යයකි. එහෙත් එම තර්ජන එල්ල වුනේ ෆැසිස්ට්වාදී දක්ෂිනාංශයෙන් නොව සමාජවාදී වාමාංශයෙනි. සෝවියට් සංගමය තුල සමාජ අසහනය, සියල්ලටත් වඩා ට්‍රොට්ස්කි විසින් මෙහෙයවූ බොල්ශෙවික් ප්‍රවනතා යලි මතුවීමට තුඩුදෙනු ඇතැයි ස්ටැලින්ට පැවති භීතිය විශේෂයෙන්ම විශිෂ්ඨ රුසියානු මාක්ස්වාදී ඉතිහාසඥයෙකු වූ වාඩිම් ඉසෙඩ් රොගොවින්ගේ කෘතීන් තුල හොඳින් වාර්තාගතවී තිබේ. සිය ස්ටැලින් හා ට්‍රොට්ස්කි චරිතාපදානයන්හි ග්‍රන්ථ ධුරාවලිය තුල, සමාජවාදී වාමාංශය හා ස්ටැලින්වාදයට එරෙහි ට්‍රොට්ස්කිවාදී වාම විපාර්ශවයේ අරගලයෙහි ඉතිහාසය පිලිබඳ රොගෝවින්ගේ වෙලුම් හත ගැන සර්විස් කිසිදු සඳහනක් නොකිරීම පුදුමයට කාරනයක් නොවේ.

ස්ටැලින් ආරක්ෂා කිරීමේ සිය ව්‍යායාමය සර්විස්, ට්‍රොට්ස්කි චරිතාපදානය තුල ද පවත්වාගෙන යයි. "ස්ටැලින් හා සමාගමේ කීර්තිය කෙලෙසීම සඳහා ට්‍රොට්ස්කි තර්ක ගොඩනනැගූ අතර, නොසිතාම පාහේ ඒවා ඔවුන් මත පැටවීම ලේඛකයන්ට පහසු කටයුත්තකි." සිය නොකැමැත්ත පලකරමින් ඔහු සඳහන් කරයි. (*Trotsky* ට්‍රොට්ස්කි, 3පි.) ඔහු මෙසේ ද කියයිඃ

> ඔහුගේ තර්කයේ බොහෝ මූලික අංශවලදී ට්‍රොට්ස්කි වැරදිය. නොවැදගත් අයෙකු නොවූ ස්ටැලින්ට ඊට වඩා මනරම් දක්ෂතා පෙලක් මෙන්ම තීරනාත්මක නායකත්වය සඳහා හැකියාවක් ද ප්‍රදර්ශනය කලේය. මර්දනකාරී තන්ත්‍රයක් මඟහැරීම ද කොමියුනිස්ට් වර්ධනය ද සඳහා ට්‍රොට්ස්කිගේ මූලෝපාය තුලින් කෙසේ වෙතත් ඉදිරිපත් කිරීමට තිබුනේ ස්වල්පයකි. (3 පි.)

"ස්ටැලින් තන්ත්‍රයේ අශෝභන අංශ සඳහා වගකිවයුතු ගැටලුවල මූලය පැවතියේ ට්‍රොට්ස්කි වෙතය. ඔහුගේ අදහස් මෙන්ම භාවිතාවන්, ස්ටැලින්වාදී

දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ප්‍රාසාදයන් පවා ගොඩනැගීම සඳහා බෝහෝ අත්තිවාරම් ගල් සම්පාදනය කලේය." (3 පි.) චරිතාපදානයේ පසුවට, *Literature and Revolution* (සාහිත්‍යය හා විප්ලවය) යන ට්‍රොට්ස්කිගේ ජනප්‍රිය කෘතිය අමු අමුවේ මුසාවාද කරමින්, පොතේ ලියා ඇති දෙයෙහි පරිපූර්න ප්‍රතිවාදය කතුවරයාගේ අදහස් ලෙස ආරෝපනය කරයි. සර්විස් මෙසේ ලියයි. "සියල්ල කීමෙන් හා කිරීමෙන් පසුව ද, සංස්කෘතික ස්ටැලින්වාදය සඳහා දර්ශනවාදී අත්තිවාරම දැමූයේ ට්‍රොට්ස්කි ය." (318 පි.)

ට්‍රොට්ස්කිගේ ලේඛනවලට එරෙහිව සර්විස් විසින් ස්ටැලින් ආරක්ෂා කිරීම වනාහි, අසාමාන්‍ය අවලාද නැගීමකි: "ස්ටැලින් ඇටුවන් බැහැපු නිලධරයෙක් වී යයි කෙරෙන චෝදනාව ගත්විට එය, ඔහුගේ ගර්වය තුල වසර ගනනාවක් පැවති හරස් නොකැපූ (?) පරිපාලනමය අධිකාරයෙන් ප්‍රමෝදයට පත්, චෝදකයා වෙතින් පලවන හාස්‍යයකි." (3 පි.) වාග් ප්‍රහාරය දිගින් දිගටම යයි.

> විදේශ කොමියුනිස්ට්වාදීන් බලය අල්ලා ගැනීමේදී ඊට සහාය දැක්වීමට ස්ටැලින් උනන්දු නොවූ බවට ට්‍රොට්ස්කි කරන ප්‍රකාශය පවා සන්නිරීක්ෂනයෙන් වලකින්නේ නොවේ. තවද, අන්තර් යුද්ධ වසරවල ජර්මනිය, ප්‍රන්සය හෝ ස්පාඤ්ඤය තුල කොමියුනිස්ට්වාදය ජයග්‍රහනය කර තිබුනේ නම් එහි ධජය ඔසවාගෙන සිටින අය ඔවුන්ගේ බලය අල්ලාගෙන සිටිනු ඇති බව සැක සහිතය. ස්ටැලින් වෙනුවට අද්විතීය නායකයා යම් විදිහකින් ට්‍රොට්ස්කි වූයේ නම්, යුරෝපය තුල රුධිර ස්නානයක් පිලිබඳ අන්තරාය බෙහෙවින් ඉහල යා හැකිව තිබුනි. (3 පි.)

කාගේ සන්නිරීක්ෂනය ද?, 1920 හා 1930 ගනන් අවධියේ ට්‍රොට්ස්කිගේ විවාදයන්හි මාතෘකාව බවට පත්ව තිබුනු බ්‍රිතාන්‍ය, චීනය, ජර්මනිය, ප්‍රන්සය, ස්පාඤ්ඤය වැනි නම්කල හැකි කිහිප තැනකදී වුවත්, ප්‍රධාන විප්ලවවාදී ගැටුම් කිසිවක් සර්විස්, තෙමේම පරීක්ෂාවට බඳුන්කොට නැත. එහෙත් උපුටා දක්වන ප්‍රකාශනයම පවා, කිසිදු ප්‍රකට හා වගකිවයුතු ඉතිහාසඥයෙකු විසින් සිදුකල හැක්කක් විය නොහැකිය. දෙවන ලෝක සංග්‍රාමය පැන නැගීමට පූර්වයෙන් වූ "පහත් වංක දශකය" (6) තුල ස්ටැලින්වාදයේ විනාශකාරී භූමිකාව, එහි දෙපිටකාට්ටුකමේ විනාශකාරී ප්‍රතිවිපාක, යුරෝපීය හා ජාත්‍යන්තර කම්කරු පන්ති ව්‍යාපාරය මත එය සිදුකල නරුම හා මිනීමරු වැඩකටයුතු, 1930 ගනන්වල බිහිසුනු සිද්ධීන් සමඟ ජීවත්වූ සමස්ත පරම්පරාවකගේම විඥානය තුලට කාවැදුනි. ස්ටැලින්වාදී භීෂනයේ බියකරු අත්දැකීම් පිලිබඳව වඩාත් ප්‍රචලිත විස්තරය ඇතුලත් *Homage to Catalonia* (කැටලෝනියාවට ප්‍රනාමය) යන ජෝර්ජ් ඕවෙල්ගේ කෘතියම වුවත් එයට සෑහෙයි.

පූම් නායක අන්ද්‍රේ නින් ගේ ඝාතනය හා වාමාංශය මැඩීම ද ඇතුලු ස්ටැලින්වාදීන් ස්පාඤ්ඤ විප්ලවය කඩාකප්පල්කිරීම පිලිබඳ නිමක් නැති පොත්, ඉතිහාසය තුල වාර්තාගතව තිබේ. ක්‍රෙම්ලිනය විසින් තෝරාගත් හා පාලනය කල ක්‍රියාකාරීන්ගේ මෙහෙයවීම යටතේ, කොමියුනිස්ට් ජාත්‍යන්තරය සෝවියට් විදේශ පිලිවෙතේ දූෂිත උපකරනයක් බවට පරිවර්තනය කිරීම, බෙහෙවින් වාර්තාගතව ඇති ඓතිහාසික සාධකයකි. 1935 දී පැවැත්වූ කොමින්ටර්නයේ හත්වන සමුලුව විසින්, ජාතික කොමියුනිස්ට් පක්ෂ "ලිබරල්" හා "ප්‍රජාතන්ත්‍රවාදී" ධනේශ්වර පක්ෂ සමඟ සන්ධාන ගතකල, පන්ති සහයෝගිතා "මහජන පෙරමුන" පිලිබඳ ඉදිරිදර්ශනයට යටත් කරන ලදී. කොමින්ටර්නය විධිමත් ලෙස දියකර හැරීම සඳහා වේදිකාව සකස්කරනු ඇති බවට ට්‍රොට්ස්කි අනාවැකි පලකල මෙම සමුලුව ගැන සඳහන් කිරීමට සර්විස් අසමත් විය. ස්ටැලින්ගේ විදේශ පිලිවෙත "තනිකර ආරක්ෂාව" බවට සිඳුවන ලද බව සිය ජනප්‍රිය කෘතිය තුල ඉතිහාසඥ ඊ. එච්. කාර් පසුකාලයකදී සඳහන් කලේය.

> ...කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තවත් සමුලු හා එහි විධායක කමිටුවේ තවත් ප්‍රධාන සැසි වාර (IKKI) යලි කවදාවත් නොකැඳවීම වැදගත් ය. ප්‍රසිද්ධියේ අවධානය වෙනත් දිසාවකට යොමුකර තිබියදී, කොමින්ටර්නය දියවීමට පටන්ගෙන තිබුනු අතර රැස්වීම් යටපත්කර දැමුනි. කොමින්ටර්නයේ හත්වන සමුලුව 'දියකර හැරීමේ සමුලුවක් ලෙස ඉතිහාසයට එක්වනු ඇත' යන ට්‍රොට්ස්කිගේ නිගමනය මුලුමනින්ම සාධාරන ය. 1943 දී පරිසමාප්තියට පත්වීම දක්වාවූ මාර්ගය, හත්වන සමුලුව පෙන්නුම් කලේය." (7)

ඔහුගේ අමූලික මුසාකරනයන් පසෙකින් සර්විස්, තමන් කියවන්නේ කුමක් පිලිබඳව දැයි සැබවින්ම විමසිලිමත්වන ඕනෑම පාඨකයෙකුට පෙනී යා යුතු, "විකාර ස්වභාවයේ වූවා නම්" වැනි ප්‍රකාශ නිකුත් කරයි. "අන්තර් යුද්ධ වසරවල ජර්මනියේ, ප්‍රන්සයේ, හෝ ස්පාඤ්ඤයේ කොමියුනිස්ට්වාදය ජයග්‍රහනය කර තිබුනේ නම්, එහි ධජය ඔසවාගෙන සිටින අය ඔවුන්ගේ බලය අල්ලාගෙන සිටිනු ඇති බව සැක සහිත" යයි සර්විස් දන්නේ කෙසේ ද? මෙම විනිශ්චයේ පදනම කුමක් ද? බටහිර යුරෝපයේ ආර්ථික හා සංස්කෘතික වශයෙන් වඩාත්ම දියුනු රටවල් දෙකෙහි කම්කරු පන්තිය, සැබවින්ම බලයට පත්වූයේ නම්, හා ඊට අමතරව, මූලෝපායිකව වැදගත් අයිබීරියන් අර්ධද්වීපයේ බලය අල්ලාගත්තේ නම්, එම විප්ලවවාදී තන්ත්‍රයන් පෙරලා දමනු ඇත්තේ කෙසේ ද? සමහරවිට වින්ස්ටන් චර්චිල් විසින් මෙහෙයවනු ලබන ධනවාදී

බ්‍රිතාන්‍යයේ පරිශ්‍රමයන් තුලින් ද? සෝවියට් රුසියාවේ පැවැත්ම සඳහා සැලකිය යුතු දායකත්වයක් සැපයූ, 1918-20 කාලයේ අධිරාජ්‍යවාදී ලොයිඩ් ජෝර්ජ් ආන්ඩුවේ බොල්ශෙවික් විරෝධී උත්සාහයට එරෙහිවූ බ්‍රිතාන්‍ය කම්කරු පන්තිය, ප්‍රන්සයේ, ජර්මනියේ හා ස්පාඤ්ඤයේ ධනවාදය පුනස්ථාපනය කිරීමේ මිලිටරි මෙහෙයුමකට සහාය දෙනු ඇතැයි සර්විස් සිතන්නේ ද?

සර්විස් කිසි වටෙකත් තවත් වැදගත් ප්‍රශ්නයක් මතු නොකරයිඃ ධනවාදයේ ප්‍රධාන යුරෝපීය මධ්‍යස්ථාන තුල කම්කරු පන්තිය විසින් ගනු ලබන එවැනි විප්ලවකාරී පියවරයන්, සෝවියට් සංගමයේ වර්ධනයන් කෙරෙහි කුමන බලපෑමක් ඇතිකල හැකි ද? ස්ටැලින්වාදී ආඥාදායකත්වයේ වැඩී ඒම තුල තීරනාත්මක සාධකය වූයේ බටහිර යුරෝපයේ විප්ලවවාදී ව්‍යාපාරය ලත් පරාජය බව ට්‍රොට්ස්කි නිතරම අවධාරනය කලේය. පැරනි බොල්ශෙවික් තන්ත්‍රය, විප්ලවවාදී ජාත්‍යන්තරවාදය ප්‍රතික්ෂේප කිරීම හා තනි රටක සමාජවාදය පිලිබඳ ස්ටැලින්-බුකාරින් න්‍යාය මඟින් එය විස්ථාපනය කිරීම, බටහිර යුරෝපයේ, විශේෂයෙන්ම ජර්මනියේ, පරාජයන්ට දේශපාලන අනුගතවීමක් විය. අනෙක් අතට ට්‍රොට්ස්කි, ධනේශ්වර රටවල විප්ලවවාදී අරගලයන්හි පුනර්ජීවනය, සෝවියට් සංගමය තුල දේශපාලන තත්වය පරිවර්තනය කරනු ඇතැයි යන මතය දැරීය. 1936 දී ඔහු මෙසේ ලිවීය.

> යුරෝපයේ විප්ලවයක පලමු ජයග්‍රහනය, සෝවියට් ජනතාව හරහා විදුලි කම්පනයක් මෙන් ගමන් කරනු ඇත. ඔවුන් නගා සිටුවා, නිදහස පිලිබඳ ඔවුන්ගේ ජීවය ඔසවා, 1905 හා 1917 සම්ප්‍රදායන් අවදිකරනු ඇත. තුන්වන (ජාත්‍යන්තරය) සඳහා ඔක්තෝබර් විප්ලවය දැරූ වැදගත්කමට නොඅඩු වැදගත්කමක් හතරවන ජාත්‍යන්තරය සඳහා අත්කර දෙනු ඇත. (8)

සෝවියට් සංගමයේ ඉරනම හා ජාත්‍යන්තර විප්ලවයේ වර්ධනය අතර සම්බන්ධතාවය පිලිබඳව ට්‍රොට්ස්කිගේ සංකල්පය, සර්විස් කිසිවිටෙකත් කෙලින් පැහැදිලි නොකලේය. එහෙත් ඔහුගේ චරිතාපදානය, දේශපාලනිකව මැදහත් විද්වතෙකුගේ කටයුත්තක් නොවීයඃ එම කාර්යය අවශ්‍යයෙන්ම පහත් ගනයට ඇද දමන්නේ එය නොවේ. චරිතාපදානය පහත හෙලන්නේ, ඓතිහාසික මුසාකරනය සඳහා අවශ්‍ය කාර්යය අභිප්‍රේරනය කල දේශපාලන දෘෂ්ටීන් හා අරමුනු විසින්ය. ලෝක විප්ලවය පිලිබඳ ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය කෙරෙහි සර්විස්ගේ දේශපාලන වෛරය, හා ස්ටැලින්ගේ ජාතිකවාදී ක්‍රියාමාර්ගය සඳහා ඔහුගේ සහයෝගය, ට්‍රොට්ස්කි චරිතාපදානය පුරා පැතිර ඇති ස්ටැලින් හිතවත් උප පෙල හඳුනාගත් අයෙකුට හොඳින් පෙනෙනු ඇත. සර්විස් මෙසේ ලියයිඃ

> යථාර්තවාදී ලෙස සෝවියට් හා ජාත්‍යන්තර කටයුතු දැකගැනීමේ සිය හැකියාව පිලිබඳව ට්‍රොට්ස්කි උද්දාමයට පත්විය. ඔහු තෙමේම රවටා ගත්තේය. සමකාලීන භූ දේශපාලනික ගතිකයන් වටහා ගැනීමෙන් ඔහු වැලැක්වූ පූර්ව සංකල්පයන් තුල ඔහුම සිරවී සිටියේය." (3 පි.)

සර්විස්ට අනුව "පූර්ව සංකල්ප" යනු විප්ලවය හා මාක්ස්වාදී ජාත්‍යන්තරවාදයයි. "සමකාලීන භූ දේශපාලනික ගතිකයන්" පිලිබඳව සලකන කල, ස්ටැලින් මෙන්ම සර්විස් ද, ජාතික රාජ්‍යයේ ප්‍රාථමිකත්වයෙන් ද එහි අවශ්‍යතාවලින් ද ධනවාදය නොනැසී පවතින්නේය යන විශ්වාසයෙන් ද ගලාආ දේ, ගැබ්කර ගත්තේය.

සියල්ල අතරින් වඩාත්ම අරුම පුදුම අවධාරනය වෙත අපි යොමුවෙමු. එනම්, "ස්ටැලින් වෙනුවට යම් විදිහකින් අද්වීතීය නායකයා ට්‍රොට්ස්කි වූයේ නම්, යුරෝපයේ ලේ ස්නානයක් පිලිබඳ අන්තරායන් බෙහෙවින් වැඩිවිය හැකිව තිබුනි" යන සර්විස්ගේ ප්‍රකාශය. 1930 හා 40 ගනන්වල යුරෝපය තුල සැබවින්ම සිදුවූ මනුෂ්‍ය ජීවිත විනාශයට වඩා වැඩි විනාශයක් කිරීමේදී, ට්‍රොට්ස්කිට කල හැකිව තිබුනේ කුමක් ද? සෝවියට් සංගමය ඇතුලත ස්ටැලින් විසින් සිදුකරන ලද කෲරකම්වලට අමතරව ස්ටැලින්ගේ ප්‍රතිපත්ති, 1933 ජර්මන් කම්කරු පන්තිය ලත් පරාජයෙන් ආරම්භවී දෙවන ලෝක සංග්‍රාමයේ සැබෑම ලේ ස්නානයෙන් කුලුගැන්වුනු සිදුවීම් වැලක් පනගැන්වීය. රුසියානුවන් මිලියන 27 ද ජර්මානුවන් මිලියන 6 ද යුදෙව්වන් මිලියන 6 ද මිලියන 3 පෝලන්ත වැසියන් ද ඇතුලුව යුරෝපය තුල දල වශයෙන් මිලියන 50 කගේ ජීවිත යුද්ධයට බිලිවිය. වක්‍රාකාරයෙන් වුවත් පෙනී යන පරිදි සර්විස්ගේ තර්කයට අනුව සමාජවාදී විප්ලවය පිලිබඳ ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය ක්‍රියාත්මකව පැවතියේ නම් තවත් මිලියන ගනනක් මියයාහැකිව තිබුනි. ජර්මනිය තුල ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය හා දෙවන ලෝක යුද්ධය පැන නැඟීමට තුඩුදෙමින් විප්ලවය අසාර්ථක වීමේ ප්‍රතිපලයක් වශයෙන් සැබවින්ම විනාශවූ ජීවිත සංඛ්‍යාව, සමාජවාදී විප්ලවය ජයග්‍රහනය කලේ නම් සිදුවිය හැකිව තිබූ ජීවිත විනාශයට වඩා අඩු විය. උපුටා ගැනීමට සිය පාඨකයන්ට සර්විස් ආරාධනය කරන නිගමනය වන්නේ, සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනය හා ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය අතර තෝරාගැනීමක් දී ඇත්තේ නම් දෙවැන්න අඩු නපුර වන බවයි.

මෙම ප්‍රකාශය යට පැවති අදහස නම්, ට්‍රොට්ස්කි ප්‍රචන්ඩ පුද්ගලයෙක්, මිනිස් ජීවිත හා දුක් පීඩා මායිම් නොකරන්නෙක්, විප්ලවයේ නාමයෙන් නිමක් නැති මිනිස් ජීවිත බිලි දීමට නොපැකිලෙන අයෙක් බවය. සර්විස් සිය චරිතාපදානය නිමාකරමින්

සඳහන් කරන පරිදි ට්‍රොට්ස්කි, "සටන් කලේ තමන් කිසිවටෙක නොසිතූ තරම් විනාශකාරී අරමුනක් සඳහා ය." (501 පි)

ට්‍රොට්ස්කි ලේ පිපාසිත උන්මත්තකයෙක් හා මිනිස් ජීවිත කුරිරු ලෙස නොතකාහල අයෙක් ලෙස වෙස්ගන්වමින් සර්විස්, ඔහුගේ මාතෘකාවේ නිර්දය භාවය පිලිබඳ නිදසුනක් සම්පාදනය කරයි. "තමන් හා බොල්ශෙවිකයන්, අව්‍යාජ ඇමරිකානු විප්ලවකාරී ව්‍යාපාරයක් ගොඩනැඟීම වෙනුවෙන් රුසියානුවන් දහස් ගනනක් දැලි අඟුරු වනතෙක් පුලුස්සා දැමීමට අදිටන් කරගෙන සිටි බව ට්‍රොට්ස්කි, 1920 ගනන් මුලදී තම ඇමරිකන් ලෝලියා වූ මැක්ස් ඊට්ස්මන් වෙත පවසමින් පෙන්නුම් කලේ සිය පරිපූර්න නොසැලකිල්ලයි. රුසියානු ගොවීන් හා කම්කරුවන් ඔහු සිතා සිටි මහා කැපකිරීම පිලිබඳව දැනගැනීමට උනන්දුවෙන් සිටියා විය හැකිය. (313 පි) සර්විස් එසේ ලියයි. මෙම ඡේදයෙන් ගනන් බැලුවේ, සිය පාඨකයන්ගේ කොඳු නාරටිය දිගේ වෙව්ලීමක් ඇති කිරීමටයි. එවන් ක්‍රියාවක් ගැන සිතිය හැක්කේ දේශපාලන උන්මත්තකභාවයේ මොන තරම් නම් අලුගෝසුවෙකුට දැයි ඔවුන් සිතනු ඇත.

එහෙත් ට්‍රොට්ස්කි ඇත්තටම එසේ කීවා ද? එසේ කීවානම් ඒ කුමන සන්දර්භයක් යටතේ ද? මෙම බිහිසුනු සැලැස්ම ගැන දැන දැනත් මැක්ස් ඊට්ස්මන්, 1920 ගනන් වලදී ට්‍රොට්ස්කිගේ වඩත්ම කැපවූ ජාත්‍යාන්තර අනුගාමිකයෙක් බවට පත්වූයේ කුමක් නිසා ද? එසේම පසුව ට්‍රොට්ස්කිගේ ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කල ප්‍රධාන පුද්ගලයා වූයේ මක්නිසා ද? මම දැන් උපුටා දැක්වූ ඡේදය ඇත්තේ, සර්විස්ගේ ට්‍රොට්ස්කි කෘතියෙහි "සංස්කෘතික පෙරමුනේදී" යන හිසින් යුත් 33 පරිච්ඡේදයේ 313 පිටුවෙහිය. *Love and Revolution: My Journey Through an Epoch ආදරය හා විප්ලවයඃ යුගයක් හරහා මගේ චාරිකාව* යන මැක්ස් ඊට්ස්මන්ගේ නිබන්ධය තම මූලාශ්‍රය බව සර්විස් සඳහන් කරයි. සත්තකින්ම එම පොතේ 333 වන පිටුවේ, ට්‍රොට්ස්කි සමඟ ඊස්ට්මන් කල සාකච්ඡාව පිලිබඳ විස්තරයක් අපට හමුවෙයි.

ඊස්ට්මන් සිය කථාන්තරය මනස්කාන්ත ලෙස පවසා ඇත. 1922 වසරේ පැවති කොමියුනිස්ට් ජාත්‍යාන්තරයේ සිව්වන සමුලුව අතරතුර දී එය සිදුවිය. එය ට්‍රොට්ස්කි සමඟ සිදුවූ ඔහුගේ ප්‍රථම හමුවයි. තමන්ට කරදර ගෙනදුන් ගැටලුවක් පිලිබඳව ට්‍රොට්ස්කිට පැවසීමට නොඉවසිල්ලෙන් පසුවූ බව ඔහු සඳහන් කරයි. ඇමරිකානු සමාජවාදී ව්‍යාපාරය අධිකාරවත් කලේ රුසියානු සංක්‍රමනිකයන් විසිනි. යෞවන කොමියුනිස්ට් පක්ෂ නායකත්වය ඔවුන්ගේ ඒකාධිකාරයක් විය. සමුලු සැසිවාරයක් තුලදී ඊස්ට්මන්ට ට්‍රොට්ස්කි වෙත එලඹීම සඳහා අවස්ථාවක් ලැබුනි. පුවත්පත්වල පලවන දෙවියන්ට සතුරු ප්‍රධාන භූත ආත්මයේ ප්‍රචලිත විකට රූප වලින් මුලුමනින්ම වෙනස් පෙනුමක් සහිත ට්‍රොට්ස්කි දැකීමෙන් මවිතයට පත් ඊස්ට්මන්, එය මෙසේ සිහිපත් කරයි. "එවන් භූතයෙකුට වඩා ඉරිදා පාසැලක (ආගමික) පන්තියක් තුල සිටි මනාලෙස පිරිසිදුවූ හොඳ ළමයෙක් ලෙස" ට්‍රොට්ස්කි දක්නට ලැබුනි.**(9)** ඊස්ට්මන් හමුවක් සඳහා කල ඉල්ලීම ට්‍රොට්ස්කි වහා පිලිගත්තේය. පසු දිනයේදී ඔවුහු, මිලිටරි විප්ලවකාරී සෝවියට් සභාවේ ට්‍රොට්ස්කිගේ කාර්යාලයේදී යලිත් හමුවූහ.

ඊස්ට්මන්ගේ සිනහ උපදවන විස්තරයේ පරිදි ට්‍රොට්ස්කි, "සැබවින්ම, කවර කලෙක හෝ සන්නද්ධ නැඟිටීමක් මෙහෙයවූ හොඳම පිලිවෙලක් ඇති පුද්ගලයා" විය. එහෙත් ඊට්ස්මන්ට විශේෂයෙන් මවිතකර වූයේ ට්‍රොට්ස්කිගේ සන්සුන් කමයි. මාගේ අදහස් සමඟ මා පොරබැදූ කැඩිච්ච ප්‍රන්ස බසට එවන් ආචාරශීලී බවකින් ඇහුම්කන්දුන් මේ දයාන්විත පුද්ගලයා, නොසංසුන් හා කලබලකාරී අයෙක් ලෙස නිරූපනය කල පුවත්පත් සටහන්, පෙනීගියේ මුලුමනින්ම ඔහු අපකීර්තියට පත්කරන දේ ලෙසය." ඊස්ට්මන් එසේ ලිවීය. රුසියානු සමාජවාදීන් ඉටුකල අධිකාරවත් ක්‍රියාකලාපය, "ඇමරිකානු විප්ලවවාදී ව්‍යාපාරයක් පනගැන්වීම කල නොහැකි දෙයක් බවට පත්කර ඇතැයි" ඊස්ට්මන් ට්‍රොට්ස්කිට පැහැදිලි කලේය. 1917 ට පෙර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් මෙන්ෂෙවිකයන් වූ නමුත්, තත්වය තවත් නරක් කලේ "ඔක්තෝබර් විප්ලවය නිර්මානය කලේ තමන් බව ඔවුන් සිතා සිටීමෙන්" ය. විහිලුවක හඬකින් ඊස්ට්මන්, හඬලන තරුන කුකුලෙක් "තමන්ගේ මිත්තනිය වීමට තරම් වයස්ගත සමහර කිකිලියන් බිත්තර දමා තිබුනු බැවින්, බොරුවට ශබ්ද නගා හැඬලූ" ආකාරයට, පැරනි මෙන්ෂෙවිකයන්ගේ රඟපෑම සමාන කලේය. මෙම ප්‍රකාශයෙන් ට්‍රොට්ස්කි ප්‍රමුදිත වූ බව ඊට්ස්මන් සිහිපත් කරයි. ඒ සමඟම ඔහු ප්‍රන්ස බසින් ඊට දුන් පිලිතුර ඊට්ස්මන්ට වචනයක් වචනයක් පාසා මතකය. ඊස්ට්මන් එහි මුල් පාඨය පසෙකින් ඉංග්‍රීසි පරිවර්තනය යොදා තිබේ. "එහෙත්, අව්‍යාජ ඇමරිකානු විප්ලවවාදී ව්‍යාපාරයක් ගොඩනැඟීම වෙනුවෙන් අපි කීප දහසක් රුසියානුවන් පිලිස්සීමට සූදානම්ය." **(10)**

සර්විස්, ට්‍රොට්ස්කි විසින් දුන් පිලිතුර හිතාමතාම හා දුෂ්ඨ ලෙස වැරදියට අර්ථ ගැන්වූ බව පැහැදිලිය. ඔහු සිටියේ ඊස්ට්මන් සමඟ විහිලු කරමිනි. ට්‍රොට්ස්කි කථා කලේ, රුසියානු කම්කරුවන් හා ගොවීන් බස්ම කිරීම ගැන නොව, ඇමරිකානු කම්කරු ව්‍යාපාරය තුල වැජඹුන උද්ධච්ඡ රුසියානු සංක්‍රමනිකයන්ගේ බලපෑම අඩුකිරීම පිලිබඳව බව ඊට්ස්මන් වටහා ගත්තේය. තව ද, සිය බොරුවේ බලපෑම දැඩි කිරීමේ අරමුනෙන් සර්විස්, ඊට්ස්මන්ගේ පෙලෙහි දකින්ට නොලැබෙන වචන ද එකතු කලේය. "දැලි අඟුරු වනතෙක් පුලුස්සා දැමීම" යන වචන මුල්

පොතෙහි දක්නට නොලැබේ. ඊස්ට්මන් විසින් දශක ගනනාවකට පසුව සිහිපත් කල හා, ට්‍රොට්ස්කි ඉවසිලි සහගත, හාස්‍යයෙන් පිරි හා හැදියාවක් ඇති අයෙක් ලෙස යහපත් ආලෝකයක් තුල පිහිටුවාලූ, හාස්‍යෝත්පාදක පුරාවෘත්තයක්, සර්විස් විසින් විප්ලවවාදී උන්මත්තකයෙකුගේ අමනුස්ස කම පිලිබඳ නිදසුනක් බවට හැරවීය.

මෙය අහිංසක කෙසේ වෙතත් නොතැකිය යුතු අතපසු වීමක් ද? මෙවැනි වර්ගයේ මුසාකරනයන් ප්‍රතිවිපාක ගෙන එයි. මුසාකරනය ග්‍රහනයෙන් මිදී ගියහොත් එය, රචනාවන්, ග්‍රන්ථ තුල යලි යලිත් පුනර්කරනය වන පිලිගත් ඓතිහාසික ව්‍යාඛ්‍යානයේ කොටසක් බවට පත්වෙයි. කාලය ගෙවී යද්දී, එය සංසරනයට දැමූ බොරුකාරයා කෙසේ වෙතත්, බොරුව හෙලිදරව් කිරීම පවා වඩාත් දුෂ්කර වෙයි.

සර්විස්ගේ චරිතාපදානය, විකෘතිකරනයේ හා මුසාකරනයේ නින්දිත හා නිර්ලජ්ජිත සාර සංග්‍රහයකි. ට්‍රොට්ස්කි ජීවත්ව සිටියදී මෙන්ම මියයන විටත් දරාසිටි අදහස් සදොස් ලෙස අර්ථගැන්වීම පමනක් සර්විස්ට සෑහුනේ නැත. පාඨකයාගේ පරිභවයට යෝග්‍ය අයෙකු ලෙස පෙනී යන පරිදි එම පුද්ගලයා හෙලාදැකීමට ද ඔහු උත්සාහ කලේය. එකම නිග්‍රහය ඔහු පුනරුච්ඡාරනය කලේය. 336 වන පිටුවේදී සර්විස් ට්‍රොට්ස්කි විස්තර කරන්නේ, "උග්‍ර මමංකාරයෙන් යුත්" අයෙකු ලෙසය. 381 පිටුවේ ඔහු ලියන්නේ ට්‍රොට්ස්කිගේ "අසම මමංකාරය" ගැනයි. ට්‍රොට්ස්කිගේ ලිපි ලේඛන පවා හාස්‍යයට ලක්කරයි. "බෙලෙක්කයකට තඩිබාන හා සෙවලකමේ සම්මිශ්‍රනය *රුසියානු විප්ලවයේ ඉතිහාසය* තුල සුරක්ෂිත" කර ඇතැයි සර්විස් ලියයි. (466 පි.) ස්ටැලින්ට එරෙහි සිය අරගලය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විස්තරය, මිනිසුන් "ස්වයංක්‍රීයව විශ්වාස කර" ඇතැයි යන්න ඔහු හාස්‍යයට ලක්කරයි. "සැබවින්ම, දේශපාලන කම්ටුව හා විපාර්ශවය අතර පරතරය කිසිවිටෙකත් ඔහු ඇඟවූ තරම් පුලුල් නොවීය." (356 පි.) මුලුමනින්ම නිවැරදි බව තහවුරු නොකල එම ප්‍රකාශය සර්විස්, තමන්ගේම අර්ථ කථනය ලෙස ඉදිරිපත් නොකරයි. ඔහු කියන්නේ එය කාරනයක් වන බවයි. එබැවින් අවිවාදිතයි! එහෙත් "කොමියුනිස්ට්වාදය කෙරෙහි ඇල්මක් නොදක්වන" බොහෝ මිනිසුන්, එසේ වුවත් "ට්‍රොට්ස්කිගේ පාලනය යටතේ සෝවියට් සංගමය ඒකාධිපති බලධාරිත්වයක් බවට පත් නොවීමට තිබුනේය යන අදහස පිලිගැනීම පුදුමයට" කාරනයක් බව සර්විස් සොයාගනියි. (356 පි.)

ඔහුගේ ග්‍රන්ථයෙහි වඩාත් අධම ගනයේ ඡේද අතර සර්විස්, මොස්කව් නඩු විභාග අවධියේ පරීක්ෂන කමිටුවක් සඳහා ට්‍රොට්ස්කිගේ කැඳවුමට සහාය දක්වමින් ඔහුගේ ආරක්ෂාව සඳහා එක්රැස්වූ ලිබරල් හා සමාජවාදී බුද්ධිමතුන් ගැන අවමානයෙන් සඳහන් කරයි. ඔවුන්ගේ ආස්ථානය "ඔවුන්ගේ බොලඳකම පිලිබිඹු කරයි" යනුවෙන් සර්විස් කියා සිටියි. "ඔවුන්ගේ වරිනාකම කෙරෙහි ට්‍රොට්ස්කිගේ සතුරුකම ගැන ඔවුන් අන්ධය. ඔහුට යම් විදිහකින් අවස්ථාවක් ලැබුනා නම් ඔවුන්ගේ වැනි සමාජයකට සිදුකිරීමට ඔහු අරමුනු කල හානිය ගැන ඔවුහු අමතක කලහ. සත්තුවත්තක සිටින නරඹන්නන් ලෙස ඔවුහු, තුවාල ලත් මෘගයා කෙරෙහි අනුකම්පාව දැක්වූහ." (466 පි)

සර්විස් මහතා ඔහුගේ වෘත්තිය අදක්ෂ ලෙසත් වංක ලෙසත් පරිහරනය කල බව මම දැනටමත් පෙන්වාදී ඇත්තෙමි. ඉහත පේලි හෙලිදරව් කරන්නේ සර්විස්, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම කෙරෙහි කිසිදු තැකීමක් නොදක්වන මිනිසෙකු ලෙසයි. සිය චෝදකයන්ට පිලිතුරු දීමත් තමන්ගේ ආරක්ෂාව සලසා ගැනීමත්, එක්සත් ජනපදයේ දේශපාලන සංස්ථාවන් කෙරෙහි ඔහුගේ අනුමැතිය පලකිරීමක් නොවීය. තමන් සභාපතිත්වය හෙබවූ පරීක්ෂන කොමිසම පිහිටුවීමේ හේතු පැහැදිලි කල ශ්‍රේෂ්ඨ ඇමරිකානු ලිබරල් දර්ශනවාදියා වූ ජෝන් ඩේවි ගේ වචන කියවා බලන ලෙස සර්විස් මහතාට උපදෙස් දිය යුතුව ඇත. ලියොන් ට්‍රොට්ස්කි බිහිසුනු අපරාධ සම්බන්ධයෙන් සෝවියට් සංගමයේ ඉහලම අධිකරනය විසින් වරදකරු බව ප්‍රකාශකොට තිබේ. ඔහුට විරුද්ධව නගා ඇති චෝදනාවන්ට පිලිතුරු දීමට ඉඩ සැලසෙන පරිදි නෝර්වීජියානු හෝ මෙක්සිකානු අධිකරනයක් හමුවේ පෙනී සිටීම සඳහා තමාගේ භාරවීම ගැන සෝවියට් ආන්ඩුව සලකා බැලිය යුතු යයි ඔහු ඉල්ලා තිබේ. මෙම ඉල්ලීම සෝවියට් ආන්ඩුව විසින් නොසලකා හැර ඇත. මෙම තත්වයෙන් පසුව සිදුවන්නේ කුමක් ද? පැහැදිලි කරමින් ඩේවි මෙසේ පැවසීයෙ

> "මෙම ඓතිහාසික ප්‍රශ්නය පිලිබඳව ලෝක හෘදසාක්ෂිය තවමත් තෘප්තිමත් නැති බවට අප මෙහි සිටීම ම සාක්ෂියක් වන්නේය යන්න සරල කාරනයකි. ඔහු මත පනවා ඇති, ඔහු පෙනී නොසිටි මෙන්ම නියෝජනය ද නොකල විභාගයක තීන්දුවට පිලිතුරු දීම සඳහා, ඔහු සන්තකව ඇති කුමන හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔහුට සම්පූර්න අවස්ථාව සලසා දීමට පෙර, අවසාන වශයෙන් ට්‍රොට්ස්කි වරදකරු නොකල යුතු යයි මෙම ලෝක හෘදසාක්ෂිය ඉල්ලා සිටියි. ට්‍රොට්ස්කි මහතා නඩු විභාගයකට පෙනී සිටීමෙන් වලක්වාලීමටත්, මෙම පරීක්ෂන කොමිසමේ කටයුතු අපකීර්තියට පත්කිරීමටත් දැරෙන උත්සාහයන් නොතිබෙන්නට, වරදකරු කිරීමට පෙර නඩු විභාගයකට පෙනී සිටීමට ඇති අයිතිය වැනි, ඕනෑම ශිෂ්ඨ රටක් තුල පැවතිය යුතු මූලිකම අයිතියක් යලි අවධාරනය කිරීමට අපට සිදුව තිබීම, හාස්‍යජනක වනු ඇත. **(11)**

ඔහු දරන දේශපාලන දෘෂ්ටීන්ගේ වාර්තාව මත, ට්‍රොට්ස්කි ආරක්ෂා කිරීමට යෝග්‍ය නොවේය යන ප්‍රකාශයන්ට ඩේවි, දෘෂ්‍යමාන කෝපයක් පලකරන තවත් ප්‍රසිද්ධ ප්‍රකාශයකින් පිලිතුරු දුන්නේය.

> කෙසේ වෙතත් සැන් ෆ්‍රැන්සිස්කෝහි ටොම් මූනිට හා බොස්ටන්හි සකෝ වැන්සෙට්ටි එරෙහි නඩුවේදී, මෙම මිනිසුන් භයානක කරදරකාරයන් වන බැවින් ඔවුන්ට එරෙහිව විභාග කරන දේ පිලිබඳව වරදකරුවන් වුවත් නැතත් ඔවුන් තොලොංචිකර දැමීම සුදුසු බව කියා සිටි ප්‍රතිගාමීන්ගේ හඬ අපට හොඳහැටි පුරුදුය. ලිබරල්වාදීන් යයි කියාගන්නා අය එවන් තර්කයක් වැලඳගන්නාවූ දිනය දැකීමට මා ජීවත්වනු ඇතැයි මම කිසිවිටෙකත් නොසිතුවෙමි. **(12)**

කොමිසමේ කටයුතු කෙරෙහි සර්විස්ගේ ද්වේෂය මනාව පැහැදිලිය. පරීක්ෂනයේ ප්‍රසිද්ධ ආධාරකරුවන්ට එරෙහිව ප්‍රචන්ඩත්වයේ තර්ජනය ද ඇතුලුව, කොමිසම කඩාකප්පල් කිරීමටත් අපකීර්තියට පත්කිරීමටත් දියත්කර තිබූ ජාත්‍යන්තර ස්ටැලින්වාදී ව්‍යාපාරය ගැන ඔහු කිසිවක් නොලියයි. ඩේවි පවුල 78 හැවිරිදි දර්ශනවාදියාගේ ජීවිතය පිලිබඳව බියෙන් පසුවූහ. "සභාපති ලෙස" ට්‍රොට්ස්කිගේ "ප්‍රියතම තේරීම" ඩේවි වීම කිසියම් අනුචිත දෙයක් සේ සර්විස් ලියයි. (466 පි.) එසේම, "ඔවුන් ට්‍රොට්ස්කිගේ දේශපාලන හා සදාචාරාත්මක වාර්තාව පිලබඳ පුලුල්ම ප්‍රශ්න විමසා බැලීම මඟහැරීමට එකඟවූහ."(467 පි.) කොමිසමේ පලමු සැසියට පෙරාතුවම, මාධ්‍යවේදී ෆර්ඩිනන්ඩ් ලුන්ඩ්බර්ග් එයින් ඉල්ලා අස්වීම ගැන සර්විස් ප්‍රීතිඝෝෂා නැඟීය. "ට්‍රොට්ස්කි, සෝවියට් සංගමයේ සිවිල් අයිතීන් පාගා දැමීමේ ප්‍රධාන නියාමකයෙක් වී යයි ද දැන් ඔහුම එහි ගොදුරක් බවට පත්වී මැසිවිලි නඟන්නේ යයි ද ලුන්ඩ්බර්ග් සිතීමට පටන් ගෙන තිබේ."(467 පි.)

1937 අප්‍රේල් මාසයේ මෙක්සිකෝවේදි පැවති කොමිසමේ විභාගයෙහි පිටපතෙන් එකම පේලියක්වත් සර්විස් සඳහන් නොකරයි. කොමසාරිස්වරු මත ඉමහත් බලපෑමක් ඇතිකල හා විභාගය නිමාවකට ගෙන ආ ට්‍රොට්ස්කිගේ සුප්‍රසිද්ධ කථාව ඔහු නොතකා හරියි. සර්විස් සඳහන් කරන්නේ කොමිසම "එකඟත්වය පලවූ තීන්දුවක්, සාරාංශ ගතකල හැකි බව ඩේවිට හැඟීයන තෙක් සම්පූර්න සතියක් තිස්සේ පරීක්ෂනය ඇදී ගියේය. එය කුමක් වනු ඇද්ද යන්න පිලිබඳව කිසිවෙකුටත් සැකයක් නොතිබුනි. ට්‍රොට්ස්කි නිර්දෝෂී විය." (467 පි.) මෙය කොමිසමේ කටයුතු සුලුකොට තැකීමක් ද කෙලෙසීමක් ද වෙයි. මෙක්සිකෝහිදී කිසිදු "එලඹගත් තීන්දුවකට" පැමිනියේ හා ප්‍රකාශකලේ නැත. සැබවින්ම, ඩේවි හා කොමිසමේ අනෙකුත් සාමාජිකයන් මෙක්සිකෝව බලා ගමන් කොට තිබුනේ, "ප්‍රාථමික කොමිසමේ" සාමාජිකයන් ලෙස ට්‍රොට්ස්කිගෙන් ප්‍රශ්න කර ඔහු සන්තකයේ තිබුනු අදාල ලිපිගොනු එකතුකර ගැනීම ද ඇතුලු ප්‍රාථමික පරීක්ෂනයක් පැවැත්වීමටය. මෙක්සිකෝවෙන් පිටත්ව යාමෙන් පසුව කොමිසම, ප්‍රාථමික වාර්තාවක් පිලියෙල කලේය. ඒ අනුව ට්‍රොට්ස්කි, "තවදුර පරීක්ෂන සඳහා ඉඩ සැලසෙන ප්‍රමානවත් සාක්ෂි ගොනුකර තිබුනු බව" වටහා ගත්තේය." **(13)** ප්‍රාථමික කොමිසම, පරීක්ෂන කොමිසමේ කටයුතු දිගටම ගෙනයා යුතු යයි නිර්දේශ කලේය. මෙක්සිකෝවේදී ට්‍රොට්ස්කිගෙන් ප්‍රශ්න කිරීමෙන් අට මාසයකට පසුව, 1937 දෙසැම්බර් වනතෙක් ඩේවි කොමිසම සිය තීන්දුව ප්‍රකාශයට පත් නොකලේය. ට්‍රොට්ස්කි නිවැරදි කරු හා මොස්කව් නඩු විභාග ගොතන ලද ඒවා බව ප්‍රකාශ කරමින් කොමිසම සිය තීන්දුව ප්‍රකාශයට පත්කලේ ඉන් පසුවය.

ප්‍රාථමික කොමිසමේ වාර්තාව ඉදිරිපත් කරමින් ඩේවි මෙසේ පැවසීයඃ

> "පරීක්ෂනයේ වැඩ කටයුතු පටන් ගත්තා පමනි. පරීක්ෂනය සඳහා විවිධ මාවත් විවෘතවී තිබේ. ඉදිරිපත්වූ සියලු කරුනු ප්‍රසිද්ධියට පත්කරන තෙක් එය දිගටම ඉදිරියට යා යුතුය. පරීක්ෂනයේ වෙනස්වූ අංශ පරීක්ෂා කිරීම අවසානය තෙක් කරගෙන යන තුරු අවසාන තීන්දුව ප්‍රමාද කල යුතුය. **(14)**

කොමිසමේ වැඩ කටයුතු අභිප්‍රේරනය කල මූලධර්ම පැහැදිලි කරමින් ඩේවි මෙසේ කියා සිටියේය. "අසත්‍ය කෙරේ මිත්‍රත්වයෙන් බැඳීම පුද්ගලයන් හා කන්ඩායම් වලට බැඳීමට වඩා ප්‍රමුඛ වේ." පරීක්ෂනය පිලිබඳ කොමිසම "කැපවූයේ එක් අරමුනකට හා එක් අරමුනකටම පමනිඃ මානුෂික වශයෙන් හැකිතාක් දුරට සත්‍යය සොයාගැනීමටයි. යුක්තියට කැපවීමත් කන්ඩායමකට බැඳී සිටීමත් අතර ද, සාධාරනත්වය හා ලෙලවන්නේ කුමන ධජය ද යන්න නොතකා ප්‍රතිගාමී වන, අන්ධකාරයට මනබැඳීම අතර ද අතර බෙදුම් කඩනයන් ඇදී තිබේ." යයි ඔහු අවධාරනය කලේය.

බොරුවට එරෙහිව ඓතිහාසික සත්‍යය ආරක්ෂා කිරීමේ අරගලය තුල සියල්ල පරදුවට තබා ඇතැයි ප්‍රකාශ කරමින් ඩේවි සමාප්ත කලේය. ට්‍රොට්ස්කිගේ ජීවිතය හා ඔහු ජීවත්වූ යුගයේ ඉතිහාසය මුසාවාදයට ලක්කිරීමේ උත්සාහයන් හෙලිදරව්කර ව්‍යර්ථ කිරීම සඳහා අප පක්ෂය මෙතරම් කාලයක් හා පරිශ්‍රමයක් යොදා ඇත්තේ මන්දැයි ඔබගේ සිතෙහි ප්‍රශ්නයක් නැඟෙන්නේ නම්, මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ, අපගේ කාලයට එතරම් අදාලවන ඩේවිගේ වචන කියවා ඒ ගැන ඕනෑකමින් සිතාබලන ලෙස හා බලාපොරොත්තු සහගතව ඒවා ඔබගේ ආදර්ශ පාඨය බවට පත්කරගන්නා ලෙසත්ය.

මෙක්සිකෝවේ කොයොවාකාන්හිදී, ස්ටැලින්වාදී ඒජන්තයෙකු වූ රේමන් මර්කේඩර් අතින් 1940 අගෝස්තු 20 දින ට්‍රොට්ස්කිගේ ඝාතනය සිදුවීමේ 70 වන සංවත්සරය එලඹෙන්නේ මේ වර්ෂයේය. ට්‍රොට්ස්කි තවමත් උග්‍ර මතභේදයක මාතෘකාව ලෙස පැවතීම අරුමයක් නොවේ. යථා ඓතිහාසික වැදගත්කමක් දරන සියලු පුද්ගලයන්ගේ ඉරනම එයයි. එහෙත් අසාමාන්‍ය කාරනය කුමක් ද යත්, ඒසා කුරිරු විරූපනයකත්, මුසාකරනයකත්, අමූලික මඩ ගැසීමකත් මාතෘකාව බවට පත්ව, ඔහුගේ ඝාතනයෙන් එතරම් වසර ගනනක් ඉක්මගොස් තිබියදී තවමත්, ඔහුගේ පැවැත්මේ පරිමානයයි. සෝවියට් නිලධරය කවර කලෙකවත් ලියොන් ට්‍රොට්ස්කි විධිමත් ආකාරයකට පුනස්ථාපනය නොකල බව ඉතිහාසය වර්තාකරනු ඇත. ඒ, මෙම කාරනය පවා වැරදියට ඉදිරිපත්කරන සර්විස්ගේ ප්‍රකාශය නොතකමින්ය. සෝවියට් සංගමය විසුරුවා හැරීමට සිව් වසරකට මඳක් වැඩි කාලයක් තුල ධනවාදයට පක්ෂපාතී ප්‍රතිපත්ති අනුගමනය කර තිබියදී පවා (ප්‍රතිපලය වූයේද එයමය) මිකායෙල් ගොර්බචොව් ප්‍රසිද්ධියේ ප්‍රකාශකලේ මෙසේය:

> ව්‍යාජ වාම විප්ලවවාදී පුරසාරම් පිටුපස සැඟවගත් ට්‍රොට්ස්කිවාදය, දේශපාලන ප්‍රවාහයක් විය. එය බලපෑවේ පරාජකවාදී ස්ථවරයක් ගැනීමටය. මෙය අනිවාර්ය ලෙසම එකදිගට ලෙනින්වාදයට එල්ල කල ප්‍රහාරයක් විය. ප්‍රායෝගිකව උත්සුකය දැනවූ කාරනය වූයේ අපගේ රටෙහි සමාජවාදයේ අනාගතයයි, විප්ලවයේ ඉරනමයි. පවතින තතු හමුවේ සමස්ත ජනතාවගේ ඇස් පනාපිට ට්‍රොට්ස්කිවාදය ප්‍රතික්ෂේප කිරීමයි. එහි ප්‍රතිසමාජවාදී සාරය නිරාවරනය කිරීමයි.

සර්විස් සිටින්නේ හුදෙක් වසර 85 කට අධික කාලයක් තිස්සේ දේශපාලන ප්‍රතිගාමිත්වයේ සේවය වෙනුවෙන් වැඩකර තිබෙන ප්‍රති ට්‍රොට්ස්කිවාදී මඩ ප්‍රහාරකයන්ගේ දිගු පේලියේ පසු පසය. ඔක්තෝබර් විප්ලවයේ විප්ලවකාරී ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයට එරෙහි තත්වාරක්ෂක ප්‍රතිගාමිත්වය, 1923 දී හිස එසවූයේ ට්‍රොට්ස්කිවාදයට එරෙහි සටනේ ධජය යටතේය. 1930 ගනන්වල මැද භාගයේදී සෝවියට් සංගමය තුල මාක්ස්වාදී දේශපාලන හා බුද්ධිමය සම්ප්‍රදායේ ඉතිරිවී සිටි නියෝජිතයන් සියලු දෙනම ක්‍රමානුකූල ලෙස කායිකව සුන්කර දැමීමේ රූපයෙන්, මෙම සටන දියත්විය. සෝවියට් සංගමයේ දේශසීමාවෙන් එපිට, ෆැසිස්ට් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී යන දෙවර්ගයේම අධිරාජ්‍යවාදී රටවල් තුල ට්‍රොට්ස්කිවාදීන් වධ බන්ධනයට ලක්විය. මා දැනටමත් සඳහන් කර ඇති පරිදි ට්‍රොට්ස්කිගේ නම සඳහන්වූ විගසම හිට්ලර්ගේ කටේ කෙල හිඳෙන්නට පටන්ගති. එක්සත් ජනපදයේ රූස්වෙල්ට් පරිපාලනය ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායකයන්ට චෝදනා නැගීම් හා හිරභාරයට ගැනීම් සංවිධානය කලේය. ලෝකය තුල, ස්ටැලින් වෛර කලාටත් වඩා ට්‍රොට්ස්කිට වෛර කල කිසිවෙකු සිටියානම් ඒ අන් කිසිවෙකු නොව වින්ස්ටන් චර්චිල්ය. 1937 දී චර්චිල් *Great Contemporaries* (මහා සමකාලීනයෝ) යන මාතෘකාවෙන් යුත් පොතක් පලකලේය. එක් පරිච්ඡේදයක් කැපකර තිබුනේ නිර්ලජ්ජිත අගැයීමක් ද සහිතව හිට්ලර් වෙනුවෙනි. එහෙත් තවත් පරිච්ඡේදයක් ට්‍රොට්ස්කිට කැප කලේය. භාෂාව පාලනයකින් තොර විය. "පිලිකා විසබීජයක් මෙන් ඔහු වැඩුනි, ඔහු පෝෂනය විය, ඔහු වධ දුන්නේය, ඔහුගේ ස්වභාවයේ ඉෂ්ඨසිද්ධිය තුල ඔහු කරකැවුනේය."**(15)** මිනිසෙක් වශයෙන් ට්‍රොට්ස්කිට එරෙහිව එල්ල කල චර්චිල්ගේ වඩාත්ම දුෂ්ට මඩගැසීම්, සර්විස් විසින් ඩැහැගෙන පොහොසත් කල බව සඳහන් කල යුතුය.

හිට්ලර්ගේ කෝපය, චර්චිල්ගේ ආක්‍රෝෂ පරිභව හා ස්ටැලින්ගේ පරපීඩක පලිගැනීම් පැහැදිලි කිරීමට අපහසු නැත. ඔවුහු ට්‍රොට්ස්කිගේ සමකාලීනයෝය, හීන සමකාලීනයෝය. ඔහුගේ කාලයේ අන් කවරෙකුටත් වඩා ට්‍රොට්ස්කි නියෝජනය කල හා මූර්තිමත් කල විප්ලවවාදී අරමුනට එරෙහිව ඔවුන් යෙදී සිටියේ ජීවිතයත් මරනයත් අතර අරගලයන්හිය. ඔවුහු ඒ බව වටහාගෙන සිටියහ. ඒ දිනවල ප්‍රවෘති පත්‍ර කියවන්න. 1930 ගනන්වල මනබඳින මහා සිදුවීම් වාර්තාකල මුල් පිටුවල සිරස්තල වලට යටින්, "ට්‍රොට්ස්කි කීවේය....ට්‍රොට්ස්කි අනාවැකි පලකලේය" වැනි කුඩා ශීර්ෂයක් සහිත වාර්තා යමෙකුට කෙතරම් සුලභව දැකගත හැකිවේ ද? මේ ආකාරයට මාධ්‍ය, දිනයේ සිදුවීම් කෙරෙහි ට්‍රොට්ස්කිගේ ප්‍රතිචාරය පාඨකයන්ට දැනුම් දුන්නේය. එහෙත් එක් මිනිසෙකුගේ ප්‍රතිචාරය ගැන එතරම් උනන්දුවක් පැවතියේ මන් ද? ඒ, එම තනි මිනිසා ලෝක සමාජවාදී විප්ලවයේ අධිකාරවත් හඬ වූ බැවින්ය. පිටුවහල්ගත විප්ලවය වූයේ ට්‍රොට්ස්කිය. දෙවන ලෝක යුද්ධය හටගැනීමට ඉතා ආසන්නයේ, 1939 අගෝසතු 31 වන දින පැරිස් සොයර් යන ප්‍රන්ස පුවත්පත, හිට්ලර් හා ප්‍රන්ස තානාපති කුලොන්ද්‍රේ අතර කෙරුනු සාකච්ඡාවක් වාර්තා කලේය. යුද්ධයේ නොවැලැක්විය හැකිබව ගැන හිට්ලර් සිය කනගාටුව පල කලේය. යුද්ධයේ කොන්දේසි තුල එකම ජයග්‍රාහකයා වනු ඇත්තේ ට්‍රොට්ස්කි බව කෙදිනක හෝ ඔබට සිතුනේ දැයි කුලොන්ද්‍රේ හිට්ලර්ගෙන් විමසීය. "ඔබ මේ ගැන සිතා බැලුවේ ද? ඔහු ඇසීය. "මම දන්නවා" හිට්ලර් පිලිතුරු දුන්නේය. වාර්තාව කියවූ ට්‍රොට්ස්කි මෙසේ ලිවීය. "මේ මහත්වරු, විප්ලවයේ අවතාරයට පුද්ගලික නමක් දැමීමට කැමැත්ත දක්වති." **(16)**

සර්විස් ට්‍රොට්ස්කි නිරූපනය කිරීමේදී, ස්ටැලින්වාදීන් ද අධිරාජ්‍යවාදීන් ද යන ප්‍රතිගාමිත්වයේ

කඳවුර නියෝජනය කලවුන්ගේ මඩ ප්‍රහාර මුලුමනින්ම පාවිච්චියට ගත්තේය. ඔහු සිය පාඨකයන්ට ඉදිරිපත් කරන විසුලු රූපය වෙනස්කරන ඕනෑම සාක්ෂියක් හඳන්වාදීම සඳහා ඉඩහැරීමට ඔහුට නුපුලුවන් විය. තවද, ට්‍රොට්ස්කි ගැන දන්නා ඔහුගේ බොහෝ අනුගාමිකයන් සිටින තත්වය තුල, සිය මරනයෙන් (සර්විස්ගේ) වසර බොහෝ ගනනකට පසුව, "මහලු මිනිසා" සැබවින්ම දන්නා, ඔහුට ගරුකරන හා ආදරය කරන කිසිවෙකුත් ඉතිරි නොවන්නේය යන කාරනය මත සර්විස් ඔට්ටු ඇල්ලීය. ට්‍රොට්ස්කිගේ ජීවිතය ගැන සාක්ෂි දරන කිහිප දෙනෙකු හමුවීමට මම වාසනාවන්ත වූයෙමිඃ අර්නි ස්වෝබෙක් හා අල් ග්ලොට්සර් - දෙදෙනාම 1930 ගනන්වල මුල ට්‍රොට්ස්කි සමඟ ප්‍රින්කිපෝ හි සති ගනන් ගතකර තිබුනි, බෙල්ජියානු විප්ලවවාදියෙක්වූ ජෝර්ජස් වෙරීකන්, ජර්මානු විප්ලවවාදියෙක්වූ ඔස්කාර් හිප්පේ, හා කොයාකානහි ට්‍රොට්ස්කිගේ ආරක්ෂක ප්‍රධානී හැරල්ඩ් රොබින්ස් එහි වූහ. මේ සියලුදෙනම ට්‍රොට්ස්කිවාදීන්ව නොසිටියහ. එහෙත් ට්‍රොට්ස්කිගේ ශ්‍රේෂ්ඨත්වය හා මනුෂ්‍යත්වය පිලිබඳව ඔවුන්ට කිසිදු සැකයක් නොතිබුනි. දශක ගනනාවක ගමන් මගෙහි දී ඔවුන් දැක ඇත්තේ සිය ජීවිතයේ වැදගත්ම අවධිය තමන් ට්‍රොට්ස්කි සමඟ ගතකල කාලය ලෙසයි.

රෙවෙක්කා මිකායිලොව්නා, ටට්යානා අයිවරොව්නා ස්මිල්ගා හා සොර්යා ලියොනිඩොව්නා සෙරෙබ්‍රියාකෝවා වැනි, නිලධරයේ ප්‍රති විප්ලවවාදී ජාතිකවාදී ක්‍රියාමාර්ගයේ මුර්ගත්වයට එරෙහිවූ, ස්ටැලින්ගේ භීෂනයෙන් දිවි රැකගත් අව්‍යාජ බොල්ශෙවික්වාදී නියෝජිතයින් මට හමුවී තිබේ. ඔවුන්ගේ පියවරුන් වාම විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් ලෙස 1937 හෝ 1938 දී වෙඩිතබා මරාදැමුනි. තවමත් ළමා වයසේ සිටියදී ඔවුන්ට ට්‍රොට්ස්කි හමුවී තිබේ. ඔවුන්ගේ ඇස් හමුවේ ඔහු දිස්වූයේ යෝධයෙකු සේය. මිකායෙල් බෝගස්ලාව්ස්කි, අයිවා ස්මිල්ගා, හා ලියෝනිඩ් සෙරෙබ්‍රියාකොව් වැනි ඔවුන්ගේ පියවරුන් ඔවුහු සිහිපත් කලහ. "ලෙව් ඩෙවිඩොවිච්" ගැන ඔවුන් කථා කලේ ගෞරවයෙන් හා සැබෑ අදරයකිනි. ටැට්යානා ස්මිල්ගා හා සොර්යා සෙරෙබ්‍රියාකෝවා තවමත් ජීවත්ව සිටින නමුත්, සර්විස් ඔවුන් හමුවී කථාකලේ නැත. නඩෙස්ඩා යොෆ, ට්‍රොට්ස්කිගේ සමීප මිතුරෙකු වූ ද ට්‍රොට්ස්කි කොමියුනිස්ට් පක්ෂයෙන් නෙරපීමට විරෝධය පලකර 1927 නොවැම්බරයේදී සියදිවි හානිකරගත්තාවූ ද ඇඩොල්ෆ් යොෆගේ දියනිය වූවාය. කුඩා දරුවෙකු ලෙස ඇයට පලමු වරට ට්‍රොට්ස්කි හමුවූයේ, 1917 විප්ලවයට පෙරාතුව වියානාහිදී ය. ඇය ට්‍රොට්ස්කිගේ බාල පුත් ලෙව් සෙඩොව් සමඟ එක්ව ක්‍රීඩා කලාය. නොසැලකිලිමත් පියෙක් ලෙස ට්‍රොට්ස්කි නිරූපනය කල සර්විස්ට සපුරා වෙනස් ලෙස නඩෙස්ඩා සිහිපත් කරන්නේ ළමුන්ට ආදරය කල ඔවුන්ගේ පොරවැදීම් සංහිඳුවීමට අසීමිත ඉවසීමකින් මැදිහත්වූ මිනිසෙකි. යොෆගේ නිබන්ධ ගැන සර්විස් සඳහන් කරන නමුදු ට්‍රොට්ස්කි පිලිබඳ ඇගේ මතකයන් ගැන ඔහු කිසිවක් සඳහන් නොකරයි.

ට්‍රොට්ස්කිගේ අසාමාන්‍ය පෞරුෂය නිරූපනය කෙරෙන වැදගත් නිබන්ධන ගනනාවක්ම තිබේ. ජේම්ස් ටී. ෆැරල් නමැති ඇමරිකානු ලේඛකයා 1937 අප්‍රේල් මාසයේ ජෝන් ඩේවි සමඟ මෙක්සිකෝවට ගියේය. වසර ගනනාවකට පසුව 1950 ගනන්වල ඔහු එම සංචාරය පිලිබඳව විස්තරයක් ලිවීය. ෆැරල් සමීපව ට්‍රොට්ස්කි නිරීක්ෂනය කලේය. "එම සතිය තුල ට්‍රොට්ස්කි, ප්‍රාථමික කොමිසමේ සාමාජිකයන් විසින් මතුකල ප්‍රශ්න වලට පිලිතුරු දීමට පැය ගනන් කාලය මිඩංගු කලේය. ට්‍රොට්ස්කි මිරිකෙන දේශපාලනික හා පෞද්ගලික පීඩනයක් යටතේ සිටියේය. සිය පැරනි සහෝදරවරු දැනටමත් මරා දමා හෝ ඝාතනයට නියමිතව සිටි මොස්කව්හි දිගහැරෙමින් තිබුනු භීෂනය පිලිබඳව, ඔහු මනාව දැන සිටියේය. ඔහුගේ බාලම පුත් සර්ගේ ඒ වනවිටත් අතුරුදහන්ව සිටියේය. ට්‍රොට්ස්කිට බලකෙරී තිබුනේ ඔහුගේ මවු භාෂාවට ආගන්තුක බසකින් ප්‍රශ්නවලට පිලිතුරු දීමටය. ට්‍රොට්ස්කි ගැන ෆැරල් මෙසේ සිහිපත් කරයි.

> ඉමහත් නිසල බවක් හා තමන් මත අසාමාන්‍ය පාලනයක් ඇති අයෙකුය යන හැඟීමක් ඔහු ඇතිකලේය. ඔහු තීරනාත්මක හා සුවිශේෂී පුද්ගලයෙක් විය. ඔහුගේ හැසිරීම ද ඔහුගේ ඇඳුම් මෙන්ම පිවිතුරු වූ අතර ඔහු සංසුන් බවේ මිනිසෙකු විය. ඔහුගේ අංග චලනය බෙහෙවින් සුමුදුය. ඔහු අසාමාන්‍ය ලෙසින් සුපරීක්ෂාකාරීය. සමහරවිට පෙනීගියේ ඔහුගේ සමස්ත ජීවයම ඔහුගේ අධිෂ්ඨානයට යටත්කර ඇති බවකි. ඔහුගේ ස්වරය තියුනු ය. ...
>
> තදින් අදින ලද දුනුදියක් මෙන් ඔහු තද ගතියකින් යුක්තය. එය කිසි විටෙක නොකැඩෙනු ඇත. එහෙත් එය යමෙකුගේ හුස්මගැනීමේ රැල්ලකින් වුවත් සසල වෙයි. ඔහුගේ ප්‍රකෘති ස්වභාවය ලෙලදෙන සුලුය. ඔහු ඉමහත් බුද්ධිමය අභිමානයකින් හා ආත්ම විශ්වාසයකින් යුත් මිනිසෙකු විය. ඔහු මෝඩ යයි සලකන ලද මුග්ධත්වය නොඉවසීය. ඔහුගේ නිසල භාවය හා අසාමාන්‍ය සුමුදු බව අත්දැකීමෙන් ලබාගත් දෙයක් ලෙස පෙනී යයි. ඔහු සුධීමත්භාවයේ, අධිෂ්ඨානයේ හා අදහස්වල මිනිසෙකි. ශිෂ්ඨ, ඉහලින්ම ශිෂ්ඨ, බටහිර යුරෝපියානු සම්භවයක් පවා ඔහු අපට සිහිගන්වයි. වර්තමානයේ සෝවියට් සංගමයේ බලය දරන මිනිසුන්ගෙන් බහුතරයක් මෙන් නොව ඔහු, බටහිර මිනිසෙකි. ඔහුගේ

මාක්ස්වාදී විශ්වාසය වනාහි අදහස්වල විශ්වාසයයි. ට්‍රොට්ස්කි ශ්‍රේෂ්ඨ මිනිසෙකු බව අපට නොවලහා කිව හැකිය. **(17)**

ට්‍රොට්ස්කිගේ සාක්ෂියෙන් මේ විස්තරය ෆැරල් ඉදිරිපත් කරයිඃ

> ට්‍රොට්ස්කි දින අටක් තිස්සේ කථාකර ඇති බවත් මොඩ පහේ කිසිවක් නොකී බවත් ඩේවි මෙක්සිකෝවේදී ප්‍රකාශ කලේය. ට්‍රොට්ස්කි කිවූ දෙයින් හෙලිදරව් වූයේ, මනුෂ්‍ය ආත්මය අවමානයට ලක් කල භීෂනයේ ද ශෝකාන්තයේ ද ලෝකයකි. "මිනිසුන් භීෂනයට හැඩගැසුනු පසු, ඒවා යහපත් ජීවන රටාවක පදනම් බවට පත්වෙයි." එසේ ලීවේ රුසියානු කවියෙකු වූ බෝරිස් පැස්ටනැක්ය. ඉතිහාසයේ භීෂනයන් ට්‍රොට්ස්කිගේ ශෛලියේ මූලික කාරක බවට පත්ව තිබුනි. සියලු මහා උත්ප්‍රාසයන් මෙන්ම ඔහුගේ උත්ප්‍රාසය නම් විරෝධාභාෂයකි. මන් ද යත්, මිනිසාගේ හේතු යුක්තියේ මුහුනත හමුවේ ඉතිහාසයේ බිහිසුනුකම් ඉහවහායන පරිද්දෙන් එල්බ තිබීමයි. අප බොහෝ දෙනෙකුට නොලැබුන හා නොලැබෙනු ද ඇති අර්ථයෙන් ඔහු, ඉතිහාසයේ මිනිසෙකු විය. යුද්ධයේ හා විප්ලවයේ පරමාදර්ශවාදය නරුමත්වය බවට හැරවීමේ, අතීත මිනිසුන් බිඳහෙලීමේ, ගෞරවය, සත්‍යය, විමුක්තිය පාවාදීමේ, සත්‍යය කනපිට පෙරලීමේ, පවුල් ද අහිංසකයන් ද වධයට පාත්‍ර කිරීමේ, බටහිර බොහෝ දෙනෙකුගේ බලාපොරොත්තුව බවට පත්ව තිබූ විප්ලවය හා සමාජය, නූතන ඉතිහාසය තුල පෙර නොවූ විරූ සැබෑම ම්ලේච්ඡත්වයක් බවට පත්වූයේ කෙසේ ද යන්න හෙලිදරව් කරමින් ඔහු කථාකරන විට ඔහුගෙන් ප්‍රකාශිත වූයේ, තම ශෛලිය, තම සිතුම් පැතුම්, තම උත්ප්‍රාසය මඟින් පරීක්ෂන ශාලාව තුල මුල්බැස ගත්තේ ඉතිහාසයේ ප්‍රචන්ඩ බලපෑම සමනය කල තානයකි. ඔහුගේ නිවුනු සාක්ෂියේ පිටපත කියවන්න, සියල්ල පැහැදිලි වනු ඇත. ට්‍රොට්ස්කිගේ සමහර අර්ථනිරූපන, සාමාන්‍ය විස්තර කථන අපගේ ඒවායින් වෙනස් වුවත්, සියලු භීෂනයන් පිලිබඳ කරුනු කාරනා හා හෙලිදරව් කිරීම් එහි තිබුනි. බලයේ සිටියදී සිදුකල ඔහුගේ සියලු ක්‍රියාවන් සඳහා සම්පූර්න සදාචාරාත්මක වගකීම භාරගනිමින් ට්‍රොට්ස්කි කථාකරද්දී, ඔහුගේ රටාව මෙම සාක්ෂියට මුලුමනින්ම කලාත්මක ස්වභාවයක් ගෙන දුන්නේය. **(18)**

මා මෙම ඡේදය එතරම් දුරකට උපුටා දැක්වූයේ ඔබ එය ඇසිය යුතු නිසාය. එයට සවන් දීම සඳහා ඔබට බුද්ධිමය හා සදාචාරාත්මක අයිතියක් ඇත. තරුන පරම්පරාව 20 වන සියවසේ විප්ලවවාදී අත්දැකීම් වලින්, බෙහෝ සෙයින්ම බුද්ධිමය වශයෙන් වියෝකර තිබේ. බොහෝ වසර ගනනක් අප ජීවත්ව ඇත්තේ දේශපාලන හා බුද්ධිමය ප්‍රතිගාමීත්වයේ වාතාවරනයක් තුලය. පසුගිය සියවසේ සිදුවීම් මුලුමනින්ම නරක ලෙස වාර්තාකර ඇතුවාක් මෙන්ම මුසාකරනයට ලක්කර හෝ සරලවම, ලියා හා සාකච්ඡාවට භාජනය කර නැතිවීම සේම නරකය. 21 සියවසේ මුල් දශකවල වැඩිවියට පත්වන තරුන පරම්පරාව විසිවන සියවසේ ඔවුන් දැන සිටිය යුතු විප්ලවයන්, ප්‍රති විප්ලවයන්, යුද්ධ හා ඒවා අවසන් කිරීමට දරන ලද උත්සාහයන් සහිත මහා සිදුවීම් දැන නොසිටීමේ අන්තරායක් පවතියි. එමෙන්ම අතීතයේ යෝධ කටහඬවල් හෝ ඔවුන් උච්චාරනය කල වචන අසාගැනීමට නොලැබෙනු ඇත.

අප එලඹෙමින් සිටින්නේ විප්ලවවාදී අරගලයේ කාල පරිච්ඡේදයකටය. මේ පිලිබඳව වැඩෙන හා එන්ට එන්ටම පැහැදිලි සලකුනු පවතියි. තර්කානුකූල හා වටහාගතහැකි කිසිවකට හසු නොවන තරම් ධනවත් අතලොස්සක් හා ලෝක මානව වර්ගයේ ඉමහත් බහුතරයක් අතර ආගාධය තව තවත් පුලුල් වෙයි. පොහොසතුන්ගේ ධනය චිරස්ථායි කිරීමටත් තර කිරීමටත් සැලසුම් කල ආර්ථික පද්ධතිය අපගේ ඇස් පනාපිට තව තවත් අවිචාරවත් ස්වභාවයක් ගනිමින් තිබේ. ගෝලීය ගැටලු, සමාජ හා පාරිසරික ව්‍යසනයන් ගෙන දෙමින් උග්‍ර අතට හැරෙයි. පෞද්ගලික අයිතිය සහිත සමාගම්වල ක්‍රියාකාරීත්වය ග්‍රහලෝකයේම පැවැත්ම අනතුරේ හෙලන බව එන්ට එන්ටම නිශ්චිත වෙමින් තිබේ. අසමානතාවය හා අසාධාරනත්වයට එරෙහිව වර්ධනය වන කෝපය, මෙම අනතුරු පිලිබඳ සැලකිලිමත්කම ඉහල යාමකි. ජනතා විඥ්ඥානයේ පරිවර්තනයක් දැන් සිදුවෙමින් තිබේ. එහෙත් විඥ්ඥානයේ වර්ධනය, ඉතිහසයේ පාඩම් වලින් පොහොසත් කල යුතුය. ලියොන් ට්‍රොට්ස්කි ද ඇතුලු අතීතයේ මහා හඬවල් වලින් ඉගෙන ගැනීමට හැකිවන පරිදිත්, ඒවායින් අප ආවේශ ගැන්වෙන පරිදිත්, ඒවා යලි ප්‍රානවත් කල යුතුය.

**සටහන්ඃ**

**(1)** *Stalin: Triumph and Tragedy* ස්ටැලින්ඃ ජයග්‍රහනය හා ශෝකාන්තය, (නිව් යෝර්ක්ඃ ග්‍රෝව් වෙඩින්ෆීල්ඩ්, 1988) 228 පි.

**(2)** එම., 254-56 පිටු.

**(3)** *The Social and Political Thought of Leon Trotsky* ලියොන් ට්‍රොට්ස්කිගේ සමාජ හා දේශපාලන චින්තනය (ඔක්ස්ෆර්ඩ් ක්ලැරිඩන් ප්‍රෙස්, 1978) viii පි.

**(4)** *Studies in Contemporary Communism* සමකාලීන කොමියුනිස්ට්වාදයේ අධ්‍යයනය, වෙලුම x, *Nos.* 1&2, ස්ප්‍රිං/සමර් 1977, 10 පි.

**(5)** *නිව් යෝර්ක් ටයිම්ස්,* 1987 නොවැම්බර් 03

**(6)** 1939 සැප්තැම්බර් 01, ඩබ්. එච්. ඕඩ්න් [http://www.poemdujour.com/Sept1.1939.html]

**(7)** *Twilight of the Comintern, 1930-35* කොමින්ටර්නයේ ගොම්මන් කාලය 1930-35, නිව් යෝර්ක්, පැන්තියන් බුක්ස්, 1982, 427 පි.

**(8)** *The Revolution Betrayed* විප්ලවය පාවාදෙයි, (නිව් පාක්; ලංඩන්, 1967, 290 පි.

**(9)** *Love and Revolution* ආදරය හා විප්ලවය, 332 පි.

**(10)** එම, 332-333 පි.

**(11)** *John Dewey: The Later Works, 1925-1953*, Volume 11: 1935-1937, Essays and *Liberalism and Social Action*, Edited by Jo Ann Boydston ජෝන් ඩේවි, පසුකාලීන කෘතීන්, 1925-53 (වෙලුම් 11: 1935-37, රචනා හා ලිබරල්වාදය හා සමාජ ක්‍රියාකාරකම්, සංස්කරනය කලේ ජෝ ඇන් බොයිඩ්ස්ටන්) 307 පි.

**(12)** එම, 317 පි.

**(13)** එම, 315 පි.

**(14)** එම, 314 පි.

**(15)** Cited in *Trotsky, Great Lives Observed*, edited by Irving H. Smith *ට්‍රොට්ස්කි* හා සඳහන් කර ඇත. *නිරීක්ෂනය කල ශ්‍රේෂ්ඨ ජීවිත, (එංගල්වුඩ් ක්ලිෆ්ස්, එන්ජේ: ප්‍රෙන්ටිස්හෝල්* 1973), 86 පි.

**(16)** "On the Nature of the USSR," in *In Defence of Marxism* ''සෝවියට් සංගමයේ ස්වභාවය පිලිබඳව'' *මාක්ස්වාදයේ ආරක්ෂාව සඳහා*

**(17)** "Dewey in Mexico," in *Reflections at Fifty* ''ඩේවි මෙක්සිකෝවෙදී'' *පනහේ ප්‍රතිබිම්බයෝ* (නිව් යෝර්ක්, වැන්ගාඩ් ප්‍රෙස්, 1954) 108-09 පි.

**(18)** එම, 111-12 පි.

**© www.wsws.org**